වාර්ෂික වාර්තාව සහ ගිණුම්

வருடாந்த அறிக்கையும் கணக்குகளும

Annual Reports & Accounts 2020



පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ஆங்கில பட்டப்பின்படிப்பு நிறுவகம்

இலங்கை திறந்த பல்கலைக்கழகம்

POSTGRADUATE INSTITUTE OF ENGLISH

THE OPEN UNIVERSITY OF SRI LANKA



පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

2020

දැක්ම

ශ්‍රී ලංකාව තුල ඉංග්‍රීසි භාෂාව අධ්‍යයනය කිරීමේ සහ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපන සහ පර්යේෂණවල නායකත්වය ඉසිලීම හා දේශීය සහ ගෝලීය අවශ්‍යතා සහ ප්‍රවණතාවලට නිර්මාණාත්මක සහ පසුබිමක් සහිතව පිළිතුරු සපයන ප්‍රමුඛතා වෙනුවෙන් ප්‍රචලිත වීම.

මෙහෙවර

ස්වයං යොමුවක් සහ ස්වයං නිදහස් ඉගෙනීම තුලින් ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය අධ්‍යයනයෙහි පශ්චාත් උපාධි මට්ටමේ අධ්‍යයනය, පර්යේෂණ, ගුරු අධ්‍යාපනය, නව සොයාගැනීම් සහ ඉගෙනීමෙහි විශිෂ්ඨතාව සඳහා අවස්ථාව ලබා දීම සහ ජාතික මට්ටමින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අධ්‍යාපනය ඉදිරියට ගෙන යාම සහ ඊට නායකත්වය සැපයීම.

අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය



1978 අංක **16** දරන විශ්වවිද්‍යාල පනත හා **2005** අංක **4** දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන පනත මඟින් ස්ථාපිත කරන ලද පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, ශ්‍රී ලංකාව තුල ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය වෙනුවෙන් කැපවූ එකම පශ්චාත් උපාධි ආයතනය වන අතර, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය පිළිබඳ වැඩිදුර සුදුසුකම් හා පුහුණුව ලබා ගැනීමට අවශ්‍ය අධ්‍යාපනඥයින් හා වෙනත් වෘත්තිකයින් වෙත ඉංග්‍රීසි භාෂා සහ සාහිත්‍යය පිළිබඳ උසස් මට්ටමේ පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා දීමේ ප්‍රමුඛ භූමිකාවක් නිරූපණය කර ඇත. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඉගෙනුම ලද ආදි විද්‍යාර්ථීන් සියලු ජාතික විශ්වවිද්‍යාලවලම පාහේ ජ්‍යෙෂ්ඨ තනතුරු උසුලන අතර, බොහෝ දෙනා පිළිගත් විදේශ විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධිය සහ වැඩිදුර සුදුසුකම් ලබා ගැනීම සඳහා මෙම ආයතනයේ ශාස්ත්‍රපති උපාධිය ද යොදා ගෙන ඇත.

සමාලෝචනයට යටත් වර්ෂයේ මාර්තු මාසය වන විට ශ්‍රී ලංකාවට සෘජුවම බලපෑම් ඇති කළ ගෝලීය කෝවිඩ් **19** වසංගත තත්ත්වය හේතුවෙන්, **2020** වසර පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට අතිශයින් අභියෝගාත්මක වසරක් විය. එසේ වුවද, මෙම වාර්ෂික වාර්තාවෙන් පෙන්නුම් කරන පරිදි, මෙම වසංගත තත්ත්වය හමුවේ ඇති වන අභියෝගවලට මුහුණ දීමට පමණක් නොව, ඉතා මැනවින් කටයුතු කිරීම සඳහා ද ආයතනය දිරිගැන්වෙන අයුරින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණය මඟින් කාලීන හා නවමු ආකාරයේ තීරණවලට එළඹෙන ලදී.පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සිය ශාස්ත්‍රීය ක්‍රියාකාරකම් සියල්ලම රජයට කිසිදු පිරිවැයක් ඇති නොකරමින් ක්‍රමානුකූලව හා ශීඝ්‍රයෙන් මාර්ගගත ක්‍රමය වෙත යොමු කර, කාර්යමණ්ඩලය, ශිෂ්‍යයින්, බාහිර කථිකාචාර්යවරුන් සහ වෙනත් පාර්ශ්වකරුවන් සඳහා පුහුණුකිරීම් පවත්වන ලද්දාක් සේම, මාර්ගගත ක්‍රමය හරහා තෝරාගැනීමේ පරීක්ෂණ ද පවත්වා, නවමු ලෙස ප්‍රතිව්‍යුහගතකරන ලද දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය වාර්තාගත ශිෂ්‍ය ලියාපදිංචිකිරීම් සංඛ්‍යාවක් සහිතව දියත් කිරීමටද සමත් විය.

අධ්‍යක්ෂ

මහාචාර්ය එච්.එස්.රඹුක්වැල්ල

ශාස්ත්‍රවේදී උපාධිය (ගෞරව) පේරාදෙණිය විශ්වවිද්‍යාලය, දර්ශනශූරී උපාධිය, හොංකොං විශ්වවිද්‍යාලය


පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

2005 ඔක්තෝබර් මස **31** දිනැති ගැසට් අති විශෙෂ නිවේදන අංක **1417/12**හි පළ කරන ලද, **2005** අංක **4** දරන ආඥාපනත මඟින් සහ**1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ **24A** වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් පනවන ලද නියෝගය යටතේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ස්ථාපිත කරන ලදී.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
සංශෝධිත වාර්ෂික වාර්තාව හා ගිණුම්
2020
අන්තර්ගත කරුණු

		පිටුව
1.	**ජ්‍යෙෂ්ඨ කලමනාකාරිත්වය පිළිබඳ කෙටි හැඳින්වීම**	**7**
	(අ) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාජිකයින්	**8**
	i) පාලක මණ්ඩලය	8
	ii) දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා වන අධ්‍යයන මණ්ඩලය	9
	iii) දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම සඳහා වන අධ්‍යයන මණ්ඩලය	10
	iv) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩලයේ සාමාජිකයින්	11
2.	**අධ්‍යක්ෂකවරයාගේ සමාලෝචනය**	**13**
	(අ) කෙටි හැඳින්වීම	13
	(ආ) වැදගත් සිදුවීම්හි සාරාංශය	16
	(ඇ) අභියෝග	21
	(ඈ) අනාගත සැලසුම්	22
3.	**කලමනාකරණ හා පරිපාලන ප්‍රගතිය**	**35**
4.	**තිරසර සංවර්ධනය සඳහා අනාගත අපේක්ෂාවන් පිළිබඳ වාර්තාව**	**36**
5.	**සංශෝධිත මූල්‍ය ප්‍රකාශ** (නව ආකෘතියට අනුගතව)	**39**
6.	**විගණන කමිටු වාර්තාව**	**41**
7.	**විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ**	**42**
8.	**විගණකාධිපතිවරයාගේ වාර්තාව**	**66**
9.	**විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු**	**74**

1. අධ්‍යක්ෂතුමා හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය පිළිබඳ කෙටි හැඳින්වීම



(අ)(i) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයින්

	නම	තනතුරු නාමය
1	මහාචාර්ය එච්.එස්.රඹුක්වැල්ල	සභාපති, අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
9.1.(ආ) උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම විෂය පැවරිය හැකි එවැනි වෙනත් අමාත්‍යාංශ ලේකම්වරයෙකු.		
2	කේ. ආර්. උඩුවාවල මහතා	අතිරේක ලේකම් (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
3	ජී. සී. එස්. තිලකරත්න මහත්මිය	අතිරේක ලේකම් (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) අධ්‍යාපන අමාත්‍යාංශය (2020 සැප්තැම්බර් සිට)
9.1.(ඇ) විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශ ප්‍රධානි;		
4	ආචාර්ය එන්. කේ. අබේසේකර	ප්‍රධානි/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
9.2. (අ) පීඨ සභාවේ නියෝජිතයෙකු		
5	මහාචාර්ය එල්.ආර්.ජයසේකර	සම්මානිත මහාචාර්ය, පැලෑටි හා අණුකජීවවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
9.2. (ආ) කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මහාචාර්යවරු පස්දෙනෙකු හෝ ඉංග්‍රීසි, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සහ වාග්විද්‍යාව (අදාල වන පරිදි) විෂයයන් ඉගැන්වීම භාර අධ්‍යයනාංශ ප්‍රධානීන්		
6	මහාචාර්ය නිලූෆර් ද මෙල්	ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
7	මහාචාර්ය ජේ.මනතුංග	සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය, මොරටුව විශ්වවිද්‍යාලය හිටපු ප්‍රධානි, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, මොරටුව විශ්වවිද්‍යාලය
8	මහාචාර්ය නෙලුක සිල්වා	මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
9	ආචාර්ය එම්. ලලිත් ආනන්ද	හිටපු ප්‍රධානි, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
10	පී. නාගසුන්දරම් මහත්මිය	හිටපු ප්‍රධානි, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
9.2. (ඇ) විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයෙකු		
11	මහාචාර්ය සි.ඊ. ගුණරත්න	ප්‍රධානි/නීති අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (2020 පෙබරවාරි සිට)
9.2. (ඈ) අධ්‍යයන මණ්ඩල විසින් සිය සාමාජිකයින් අතුරින් පත්කරගන්නා ලද සාමාජිකයින් දෙදෙනෙකු		
12	ආචාර්ය එච්.වී.එම්.රත්වත්තේ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය/විවෘත විශ්වවිද්‍යාලය සාමාජික - අධ්‍යයන මණ්ඩලය/ දෙවන බස ලෙස භාෂාව ඉගැන්වීම
13	ආචාර්ය එස්.එම්.හේරත්	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සාමාජික - අධ්‍යයන මණ්ඩලය/දෙවන බස ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම
9.2. (ඉ) තාක්ෂණික, අධ්‍යාපනික හෝ පරිපාලනමය ක්ෂේත්‍ර වෙනුවෙන් විශිෂ්ට දායකත්වයක් ලබා දෙන ලද පුද්ගලයින් අතුරින් කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින් දෙදෙනෙකු		
14	ආචාර්ය උපාලි සේදර	අනුශාසක, ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන මධ්‍යස්ථානය
15	දේශබන්ධු මහාචාර්ය එම්.ඒ.ඩී.එස්.ජේ.එස්.නිරිඇල්ල	ජාත්‍යන්තර නීති අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
9.2.(ඊ) ගුරු අධ්‍යාපනය නියෝජනය වෙනුවෙන් ජාතික අධ්‍යාපන ආයතනය විසින් නම් කරනු ලබන අයෙකු		
16	වී.ඩී.සී.පී. පෙරේරා මහත්මිය	අධ්‍යක්ෂ/බාහිර සම්පත් කළමනාකරණ ඒකකය හා අධ්‍යක්ෂ ඉංග්‍රීසි (රාජකාරී ආවරණය කරන), ජාතික අධ්‍යාපන ආයතනය
මහා භාණ්ඩාගාරයේ නියෝජිත		
17	ජේ. ජයසුන්දර මහතා	අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය

(ii) <u>දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි බස ඉගැන්වීම සඳහා වන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයින්</u>

	නම	තනතුරු නාමය
1	මහාචාර්ය එච්.එස්.රඹුක්වැල්ල	සභාපති, අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (අ) සභාපතිවරයා බවට පත්වන අධ්‍යක්ෂතුමා;		
2	ආර්.අමරසේකර මහත්මිය	නියෝජ්‍ය පුස්තකාලයාධිපති/ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (ආ) තොරතුරු තාක්ෂණවේදයට අදාල පුස්තකාල හා වෙනත් මාධ්‍ය සම්පත් ඇතුලත් වන, ආයතනයේ ඉගෙනුම් සම්පත් භාර කරු;		
3	ආචාර්ය එච්.ඩී.විජේසේකර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
4	එම්.අයි.ජෑන්ස් මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
5	ආචාර්ය එස්.එම්.හේරත්	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (ඇ) අදාල මණ්ඩලයට හෝ ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන අධ්‍යයන මණ්ඩලවලට අදාල වන පරිදි ආයතනයේ ස්ථිර ගුරු භවතුන්;		
6	පී.සී. පෙරේරා මහත්මිය	ශිෂ්‍ය නියෝජිත
12. (1) (ඈ) ආයතනයේ ශිෂ්‍යයින් විසින් පත්කරගනු ලබන ශිෂ්‍යයින් දෙදෙනෙකු;		
7	එල්.කේ.කුමාරණතුංග මහත්මිය	බාහිර කථිකාචාර්ය/දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (සාමාජික)
8	පී.නාගසුන්දරම් මහත්මිය	බාහිර කථිකාචාර්ය/දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (සාමාජික)
9	ආචාර්ය ආර්.රසූල්	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය
12. (1) (ඉ) ආයතන කාර්යමණ්ඩල සාමාජිකයින් නොවන, ආයතනයට අදාල අධ්‍යයන ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වය ප්‍රකට කළ පුද්ගලයින් අතුරින් අදාල අධ්‍යයන මණ්ඩල විසින් පත් කරගනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු;		
10	ආචාර්ය ඩී.දේවේන්ද්‍ර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
11	ආචාර්ය කේ.ආර්.එම්. ද සිල්වා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (ඊ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් නෝරාගන්නා ලද, මණ්ඩලයේ විෂය පථය යටතට ගැනෙන විෂයයන් උගන්වනු ලබන පුද්ගලයින් දෙදෙනෙකු;		

(iii) <u>දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයින්</u>

	නම	තනතුරු නාමය
1	මහාචාර්ය එච්.එස්.රඹුක්වැල්ල	සභාපති, අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (අ) සභාපතිවරයා බවට පත්වන අධ්‍යක්ෂතුමා;		
2	ආර්.අමරසේකර මහත්මිය	නියෝජ්‍ය පුස්තකාලයාධිපති/ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (ආ) තොරතුරුනාක්ෂණවේදයටඅදාල පුස්තකාල හා වෙනත් මාධ්‍ය සම්පත් ඇතුලත් වන, ආයතනයේ ඉගෙනුම් සම්පත් භාර කරු ;		
3	ආචාර්ය එච්.ඩී.විජේසේකර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
4	එම්.අයි.ජෑන්ස් මහත්මිය	කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
5	ආචාර්ය එස්.එම්.හේරත්	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (ඇ) අදාල මණ්ඩලයට හෝ ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන අධ්‍යයන මණ්ඩලවලට අදාල වන පරිදි ආයතනයේ ස්ථිර ගුරු භවතුන් ;		
6	එම්.එස්.වී. ද අල්විස් මහත්මිය	ශිෂ්‍ය නියෝජිත
7	එම්.එස්.එස්. පෙරේරා මහතා	ශිෂ්‍ය නියෝජිත
12. (1) (ඈ) ආයතනයේ ශිෂ්‍යයින් විසින් පත්කරගනු ලබන ශිෂ්‍යයින් දෙදෙනෙකු ;		
8	ආචාර්ය ඩී.දේවේන්ද්‍ර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
9	ආචාර්ය එච්.වී.එම්.රත්වත්තේ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (ඉ) ආයතන කාර්යමණ්ඩල සාමාජිකයින් නොවන, ආයතනයට අදාල අධ්‍යයන ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වය ප්‍රකට කළ පුද්ගලයින් අතුරින් අදාල අධ්‍යයන මණ්ඩල විසින් පත් කරගනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු;;		
10	මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ	ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මහාචාර්ය (ප්‍රධානි)/ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
11	ආචාර්ය වී.වී.මැදවත්තේගෙදර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12	ආචාර්ය ජේ.කෙනඩි	ප්‍රධානි/ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
12. (1) (ඊ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, මණ්ඩලයේ විෂය පථය යටතට ගැනෙන විෂයයන් උගන්වනු ලබන පුද්ගලයින් දෙදෙනෙකු;		
13	ආචාර්ය එස්.විජේවර්ධන	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
14	ආචාර්ය කේ.වර්ණපාල	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
12. (1) (උ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, ඉහත සඳහන් වර්ගීකරණය යටතට නොගැනෙන ගුරුවරුන් දෙදෙනෙකු ;		

(iv) <u>පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩල සාමාජිකයින්</u>

ස්ථිර කාර්යමණ්ඩල සාමාජිකයින්

	නම	තනතුරු නාමය
1	ආචාර්ය එච්.එස්. රඹුක්වැල්ල දර්ශනශූරී (හොංකොං)	අධ්‍යක්ෂ
2	ආචාර්ය එච්.ඩී.විජේසේකර දර්ශනශූරී (ක්වීන්ස්ලන්ත තාක්ෂණවේද විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
3	ආචාර්ය එස්.එම්. හේරත් දර්ශනපති(ටොරොන්ටෝ, කැනඩාව)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
4	එම්. අයි. ජෑන්ස් මහත්මිය දර්ශනශූරී (කැලණිය)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
5	ඩබ්ලිව්.ඩී.ටී. තිලකරත්න ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (අධ්‍යයනය කරමින් සිටියි), විද්‍යාවේදී (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
6	එස්. සී. මුණසිංහ මහත්මිය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (අධ්‍යයනය කරමින් සිටියි), විද්‍යාවේදී (ජයවර්ධනපුර)	සහකාර මූල්‍යාධිකාරි
7	ජී.පී.අයි.ඩී. සිරිවර්ධන මහත්මිය	කලමනාකරණ සහකාර
8	එච්.එන්.එන්. පෙරේරා මහතා	කලමනාකරණ සහකාර
9	ඩී.එම්.ටී.පී. දිසානායක මහත්මිය ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (අධ්‍යයනය කරමින් සිටියි), ශාස්ත්‍රවේදී (පේරාදෙණිය)	කලමනාකරණ සහකාර
10	ඒ.ආර්.එස්.කේ. රාජපක්ෂ මහත්මිය	කලමනාකරණ සහකාර(පොත් තබන්නා)
11	ඒ.ජී.ආර්.එම්.ඩී.කේ. රණවීර මහත්මිය එච්එන්ඩීඒ (ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය)	කලමනාකරණ සහකාර
12	ඩබ්ලිව්.එම්.ඩී.ආර්.බී. වීරසිංහ මහතා	කාර්ය සහායක
13	ආර්.යූ. ජයසිංහ මහතා	කාර්ය සහායක

සේවක වර්ගීකරණය				
සේවය	වැටුප් කේතය	අනුමත කරන ලද කාර්යමණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය 2020/12/31 දිනට	පුරප්පාඩු 2020/12/31 දිනට
ප්‍රාථමික මට්ටම				
ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු	PL - 1	2	2	
ද්විතීයික මට්ටම				
කලමනාකරණ සහකාර	U – MN 1	5	5	
තෘතියික මට්ටම				
විධායක - කනිෂ්ඨ මට්ටම	U – EX 1	1	1	
ජ්‍යෙෂ්ඨ මට්ටම				
විධායක - මධ්‍යම මට්ටම	U – EX 2	1	1	
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/කථිකාචාර්ය (පරිවාස)	U – AC 3	3	3	1
මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U – AC 5	2	1	
මුළු එකතුව		**14**	**13**	**1**

කොන්ත්‍රාත්ගත කාර්යමණ්ඩල සාමාජිකයින්

	නම	තනතුරු නාමය
1	එස්. සෙනෙවිරත්න මහත්මිය ශාස්ත්‍රපති (ලන්ඩන් යුනිවර්සිටි කොලීජිය, එක්සත් රාජධානිය)	කථිකාචාර්ය
2	එස්.එල්. රණසිංහ මහත්මිය විද්‍යාවේදී (පේරාදෙණිය)	ශාස්ත්‍රීය සම්බන්ධීකරණ නිලධාරි
3	ඒ.එන්.එස්. සිල්වා මහතා තාක්ෂණවේදී (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)	ශාස්ත්‍රීය සම්බන්ධීකරණ නිලධාරි
4	පී.කේ.සී. ද සිල්වා මහතා වාණිජවේදී (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)	ව්‍යාපෘති සහකාර

2. අධ්‍යක්ෂකවරයාගේ සමාලෝචනය

(අ) කෙටි හැඳින්වීම

සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශ ද්විත්වයටම එක හා සමානව, **2020** වර්ෂය කොරෝනා වසංගතය හේතුවෙන් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂාආයතනයට අභියෝගාත්මක වසරක් විය. මෙම වසරේදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය දැඩි ලෙස අපේක්ෂාවෙන් සිටි ව්‍යාපෘතිවලින් එකක් වූ, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (MA TESL) දියත් කිරීමට අප ආයතනය සැලසුම් කළේය. එසේ වුවද, කෝවිඩ් වසංගතය හේතුවෙන් නිර්මාණය වූ ප්‍රධාන අභියෝග නොතකා, ආයතනයේ කාර්යමණ්ඩලයෙන් ලද විශිෂ්ට සහාය හා සම්බන්ධීකරණය මෙන්ම කාලීන සැලසුම් කරණකොටගෙන, සිය අධ්‍යාපනික සේවා බාධාවකින් තොරව පවත්වාගෙනයාමටත්, සැලසුම් කළ පරිදි, වැඩසටහන සඳහා වාර්තාගත ලෙස ශිෂ්‍යයින් **140**දෙනෙකු ලියාපදිංචිකරගනිමින් ප්‍රතිව්‍යුහගත කළ දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (MA TESL) දියත් කිරීමටද පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකි විය. පෙර වැඩසටහන් ක්‍රමවේදයට අනුව වර්ෂයකට ශිෂ්‍යයින් **40-50** අතර ප්‍රමාණයක් පමණක් ලියාපදිංචි කළ හැකි වූ හෙයින්, මෙය ශිෂ්‍යයින් ලියාපදිංචිකිරීමෙහි **300%**ක ඉහළයාමක් පෙන්නුම් කරයි. මීට අමතරව, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය තිරසර ලෙස සිය ශිෂ්‍යයින් සමත්වීම ඉහළ නංවා ඇත. **2005** වර්ෂයේ සිට **2014** වර්ෂය දක්වා මෙම ආයතනයෙන් උපාධිය ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව **20**ක් විය. එහෙත්, **2015** වර්ෂයේ සිට **2020** වර්ෂය දක්වා ශිෂ්‍යයින් **127**දෙනෙකු වෙත උපාධිය ලබා දීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකි වීම මගින් ආයතනයේ කාර්යසාධනය සුවිශේෂී ලෙස ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කරමිනි. මීට අමතරව, **2021** වර්ෂයේදී ශිෂ්‍යයින් **75**දෙනෙකු පමණක් ඉංග්‍රීසි භාෂාව ව්‍යත්තීයමය ලෙස භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හා ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් දෙක හැර) සම්පූර්ණ කරනු ලබන අතර, එනිසා, සංඛ්‍යාව ශීඝ්‍රයෙන් ඉහළ යනු ඇත.

මාර්තු මාසයේදී රට අගුලුදමන ලද අවස්ථාවේදී, මිශ්‍ර ක්‍රමයක් (විවෘත දුරස්ථ සහ මුහුණට මුහුණ) අනුගමනය කරන ලද ආයතනයක් වුවද, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සතුව ක්‍රමානුකූලව මාර්ගගත පාඨමාලා පැවැත්වීමේ ක්‍රමවේදයක් නොතිබුණු අතර, සීමිත වශයෙන් භෞතික ලෙස ශිෂ්‍යයින් සඳහා වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් මෙම ආයතනයට සුවිශේෂී අත්දැකීමක් හිමි විය. මෙම අගුලුදැමීම ඉක්මණින් අවසන් නොවන බව සහ එය අවසන් වුවත්, මුහුණට මුහුණ පන්ති පැවැත්වීමට හැකි නොවන බව පැහැදිලි වූ වහාම, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හරහා ප්‍රවේශ විය හැකි අධ්‍යාපන කාර්යයන් වෙනුවෙන් සකසා ඇති Google Suite මාර්ගගත ක්‍රමවේදයක් ක්‍රමානුකූලව වැඩිදියුණුකිරීම මෙම ආයතනය විසින් ආරම්භ කරන ලදී. පළමුව, Google පන්තිකාමර අරඹා, තාක්ෂණවේදය අත්හදාබලන ලද අතර, ශාස්ත්‍රීය කාර්යමණ්ඩලය මාර්ගගත ලෙස පවත්වන ලද සජීවී පුහුණුව සඳහා සහභාගි විය. ඉන් අනතුරුව, සාපේක්ෂ වශයෙන් සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා මාර්ගගත ශාස්ත්‍රීය ඉගැන්වීම් හා දේශන අත්හදාබලන ලදී. මෙම මූලික මාර්ගගත ඉගැන්වීම්-ඉගෙනුම් අත්හදාබැලීම් සමඟ මෙම ආයතනයද නිරන්තරයෙන් එම ක්‍රමවේදය වැඩිදියුණු කිරීම උදෙසා ශිෂ්‍යයින්ගේ ප්‍රතිපෝෂක ඉල්ලා සිටියේය.මින් අනතුරුව, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මාර්ගගත ඉගැන්වීම් සිදු කරන බාහිර කථිකාචාර්යවරුන් සඳහා නව ගෙවීම් ක්‍රමවේද

හඳුන්වා දුන් අතර, ශිෂ්‍යයින්ගේ සහභාගිත්වය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යන ලද බව තහවුරු කළ සජීවී හා ස්වේච්ඡා ඉගෙනුම් ප්‍රවේශයක් (synchronous plus asynchronous approach) වැඩිදියුණු කළේය. ඉක්බිති, විද්‍යුත් තැපෑල මගින් අදාල මෙමෝ පත්‍ර බෙදාහැරීම මගින් පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන, විධිමත් අයුරින් ඉගැන්වීම ආරම්භ කරන ලදී. දැනට ක්‍රියාත්මක වැඩසටහන් මාර්ගගත ඉගෙනුම් ක්‍රමයට මෙලෙස මාරුවීම මගින් දැනට පවත්වනු ලබන දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි (MA TLSC) වැඩසටහන සහ ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය ලෙස භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDip PPE) මෙන්ම අලුතින් ප්‍රතිව්‍යුහගත කළ දෙවන බස පසුබිමක් තුල ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි (MA TESL) වැඩසටහන ද ප්‍රචාරණය කර, ඒ සඳහා නව ශිෂ්‍යයින් ලියාපදිංචි කරගැනීම සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට කදිම තෝතැන්නක් සපයන ලද බව අදහස් කෙරිණි.

දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි (MA TLSC) වැඩසටහන හා අලුතින් ප්‍රතිව්‍යුහගත කළ දෙවන බස පසුබිමක් තුල ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි (MA TESL) වැඩසටහන සඳහා සිත් හා නෙත් පැහැරගන්නා ආකාරයේ වෙළඳ ප්‍රචාරණයක් ලබාදීමට ද පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අපේක්ෂා කළ හෙයින්, මෙම වැඩසටහන් දෙක පිළිබඳ උසස් මට්ටමේ වීඩියෝපට දෙකක් නිෂ්පාදනය කිරීමට පුළුල්ශාස්ත්‍රවේදීන් හා කලා නිර්මාණකරුවන්ගේ ජාලයක මනා දායකත්වය හිමි වූ අතර, එය ෆේස්බුක් සමාජ මාධ්‍යය තුල **10,000**කට වැඩි පිරිසක් නරඹා තිබිණි. ඊට අමතරව, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මාර්ගගත වෙළඳ ප්‍රචාරණ වැඩසටහන් තුල ඉහළ ඵලදායීතාවක් පෙන්නුම් කළ කෙටි වීඩියෝපට (shorter teaser) නිර්මාණය කිරීම සඳහා අභ්‍යන්තර කාර්යමණ්ඩලයේ විශේෂඥ දැනුමද මෙම ආයතනය මගින් යොදාගන්නා ලදී. ක්‍රමානුකූල, එහෙත්, ශීඝ්‍ර මාර්ගගත ශාස්ත්‍රීය පුහුණුව සහ ශිෂ්‍ය නම්නීකරණය හා නිවසේ සිට මාර්ගගත ක්‍රමය හරහා සේවය කිරීමට අනුගතවීම සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩලය දක්වන ලද නම්‍යශීලීතාව මගින් තහවුරු කරන ලද්දේ, දෙවන භාෂාවක් ලෙසඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හා ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය ලෙස භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් මගින් නව ශිෂ්‍යයින් ලියාපදිංචි කර, දැනට ක්‍රියාත්මක ඉගැන්වීම් හා ඇගයීම් පවත්වාගෙන යාමට හැකියාව ඇති බවයි. එම වසරේ පසු කාලයකදී, ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද මාර්ගගත ක්‍රමයට යොමු කරන ලදී. මෙම සාමූහික ප්‍රයත්නයේ සමුච්චිත ප්‍රතිලාභය බවට පත් වූයේ, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට සාපේක්ෂ වශයෙන් ඉතා අඩු බාධා සහිතව සිය ශාස්ත්‍රීය කටයුතු පවත්වාගෙනයාමටත්, ප්‍රතිව්‍යුහගත කළ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන තුල ශිෂ්‍ය ලියාපදිංචිකිරීම් මගින් ආයතනය වෙත වාර්තාගත ආදායමක් ඉපැයීමටද හැකිවීමත්ය. ශිෂ්‍ය සංඛ්‍යාව සහ මූල්‍ය තොරතුරු පහත සඳහන් පරිදි වේ.

බොහෝ අභියෝග නොසලකමින්, සැලසුම් කළ සිය කෙටි පාඨමාලා දෙකද පවත්වාගෙන යාමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකි විය

වර්ෂය	පාඨමාලා සංඛ්‍යාව		
	පූර්ණ කාලීන	කෙටි පාඨමාලා	මුළු
2015	**03**	**02**	**05**
2016	**03**	**05**	**08**
2017	**03**	**05**	**08**
2018	**04**	**03***	**07**
2019	**05**	**02***	**07**

2020	05	02	07

එක් එක් වැඩසටහන සඳහා ලියාපදිංචි වන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ශාස්ත්‍රපති උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/කෙටි පාඨමාලා)

වර්ෂය	දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ,ශාස්ත්‍රපති උපාධිය (TESL)	දෙවනබස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම - ශාස්ත්‍රපති උපාධිය (TLSC)	ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (BE)	ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය ලෙස හැසිරවීම - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PPE)	කෙටි පාඨමාලා	මුළු
2015 (2014/15)	140	14	-	-	64	218
2016 (2015/16)	155	19	-	-	189	363
2017 (2016/17)	176	45	-	-	169	390
2018 (2017/18)	191	56	-	-	60	307
2019 (2018/19)	193	64	40	-	27	391
2019/20	203	75	50	67	45	430
31/12/2020 දිනට (2020/2021)	285	107	84	45	50	568

ශිෂ්‍ය ප්‍රතිඵල

වර්ෂය	TESL		TLSC		PPE	මුළු
	PGDip	MA	PGDip	MA		
2015 (2014/15)	-	02	-	-	-	02
2016 (2015/16)	05	05	-	-	-	10
2017 (2016/17)	04	09	-	-	-	13
2018 (2017/18)	02	12	-	02	-	16
2019 (2018/19)	07	09	01	01	-	18
2020 (2020/2021)	07	17	01	01	41	67

2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පූර්ණකාලීන වැඩසටහන්වල ශිෂ්‍ය ප්‍රතිඵල වැඩිවීම

	උපාධිය ලත් ශිෂ්‍ය සංඛ්‍යාව	සම්පූර්ණ කළ ප්‍රතිශතයේ ඉහළයාම% (ආ/අ) *100
2005 සිට 2014 දක්වා(අ)*	20	
2015 සිට 2020 දක්වා (ආ)	126	630%

* සටහන: 2005-2014 දක්වා උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍යයින් සංඛ්‍යාව 20ක් විය.

2015-2020 කාලසීමාව තුල පමණක් ශිෂ්‍යයින් 126දෙනෙකු ශාස්ත්‍රපති උපාධිය සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම්වලින් සමත් වී ඇති අතර, එය, 2015දී උපාධිය ලත් සමුච්චිත ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව ප්‍රතිඵලවල 630%ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

ඊට අමතරව, 2020 වර්ෂය තුල පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත රු.7,766,962ක අතිරික්ත ආදායමක් වාර්තා කරමින් එම කාලසීමාව තුලම අගය කළ හැකි මට්ටමින් මෙම ආයතනයේ මූප්‍ය කාර්යසාධනය ඉහළ යන ලදී. මෙම කාලසීමාව තුල මුළු ආදායම රු.18,352,733ක් වූ අතර, ස්ථීර කාර්යමණ්ඩලයේ වැටුප් හැර, මුළු පුනරාවර්තන වියදම රු.5,635,795ක් විය.


ඉහත සඳහන් දත්තවලින් පෙනී යන පරිදි, 2020 කොරෝනා වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සුවිශේෂී ශාස්ත්‍රීය හා මූල්‍ය කාර්යසාධනයක් අත්කරගෙන ඇත.

(ආ) 2020 වර්ෂයේ සුවිශේෂී සිදුවීම්


මෙම කොටස මගින් සමාලෝචන වර්ෂය තුල පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ළඟාකරගෙන ඇති සුවිශේෂී ආයතනික ජයග්‍රහණ පිළිබඳ කෙටි සාරාංශයක් ඉදිරිපත් කෙරේ. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යසාධනය පිළිබඳ තවත් විස්තරාත්මක සහ වෙන් කළ සංඛ්‍යා දත්ත මෙම වාර්ෂික වාර්තාවේ පසු කොටස්වල ලබා දී ඇත.

- පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සිය දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ප්‍රචාරණය කිරීම උදෙසා වීඩියෝපට හතරක් නිර්මාණය කළේය. අභ්‍යන්තර කාර්යමණ්ඩලය මගින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දක්ෂතා හා කුසලතා භාවිත කරමින් වීඩියෝපට දෙකක් නිෂ්පාදනය කරන ලද අතර, ආයතනයේ මිත්‍ර ජාලය භාවිත කරමින් වෘත්තීයමය ලෙස තවත් වීඩියෝපට දෙකක් නිර්මාණය කරන ලදී. මෙම වීඩියෝ නිෂ්පාදන දෙකම කිසිදු පිරිවැයකින් තොරව නිපදවන ලද අතර, මුහුණු පොතින් ලද සංඛ්‍යා දත්තමය සාක්ෂි සමඟ පුළුල් ප්‍රේක්ෂක සංඛ්‍යාවක් කරා ළඟාවීමට එකී වීඩියෝපටවල බලපෑම පෙන්නුම් කරයි. විස්තර පහතින් දැක්වේ.

දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය පිළිබඳ වීඩියෝපටය - 9000කට අධික පිරිසක් නරඹන ලද



දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය පිළිබඳ වීඩියෝපටය - **6000**කට අධික පිරිසක් නරඹන ලද



- සිය වැඩසටහන් සියල්ලම සඳහා පරිපූර්ණ Googleපන්තිකාමර ක්‍රමවේදයක් ආයතනය විසින් වැඩිදියුණුකරන ලදී. මෙම ක්‍රමවේදය සමඟම, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සියලුම


වර්තමාන සහ නව ශිෂ්‍යයින් වෙත “ousl.lk” ඩොමේනය සහිත ඊටම සුවිශේෂී විද්‍යුත් තැපැල් ලිපිනයක් හිමි විය.

සංවාද මණ්ඩප, බහුවරණ ප්‍රශ්න, කෙටි පිළිතුරු ලබා දිය යුතු ප්‍රශ්න, සමීක්ෂණ, ඩිජිටල් මාධ්‍යයෙන් ඉදිරිපත් කෙරෙන ජෑම්බෝඩ් යනාදී බහුවිධ ඇගයීම් විකල්පවලට අමතරව, මෙම පන්තිකාමර පරිපූර්ණ වීඩියෝපට, ශ්‍රව්‍ය, දෘශ්‍ය හා මුද්‍රිත අන්තර්ගතයන්ගෙන් සමන්විත වේ.

එසේම, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාවගෙන් බහුතරයක් රැකියාවල නියුතු වැඩහිටියන් වන හෙයින්, මාර්ගගත මාධ්‍ය ඔස්සේ ලබා දී ඇති නම්‍යශීලීතාව ශිෂ්‍යයින්ගේ සහභාගිත්වය සුවිශේෂී ලෙස ඉහළ නංවා ඇත. ශිෂ්‍යයින් හට මෙය වඩාත් පහසු වී ඇත්තේ සජීවී දේශනවලින් අනතුරුව උඩුගත කරනු ලබන දේශනවල වීඩියෝ පටිගතකිරීම් ඔවුන්ට පසුව ලබාගතහැකි හෙයිනි.

මාර්ගගත ඇගයීම් ක්‍රමය දැනට ආයතනය විසින් කටයුතු කරනු ලබන එක් ක්ෂේත්‍රයක් වන්නේ, තාක්ෂණික සීමාමායිම් හේතුකොටගෙන, ඇගයීම් තුල වංචා සිදු කළ හැකි හෙයින් සහ ඇගයීම්වල ගුණාත්මකබව කෙරෙහි සෘණාත්මක බලපෑම් ඇති කළ හැකි මාර්ගගතව පිටපත් කිරීම සිදුවිය හැකි හෙයිනි.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ **Google** පන්තිකාමරයේ දසුනක්



- මැයි 31 දින දක්වා අගුලු දමන ලද කාලසීමාව තුල පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ඉංග්‍රීසි භාෂාව ව්‍යත්තීයමය ලෙස හැසිරවීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා සම්පූර්ණයෙන් මාර්ගගතව තෝරාගැනීමේ පරීක්ෂණය පවත්වන ලදී. කිසිදු ශිෂ්‍යයෙකුගේ සහභාගිත්වයෙන් තොරව මෙම සම්පූර්ණ ක්‍රියාවලියම සිදු කරන ලදී. Google Form භාවිත කරමින් අයදුම්පත්‍ර බාරගන්නා ලද අතර, මාර්ගගත වීඩියෝ සම්මුඛ පරීක්ෂණයක් ඔස්සේ Google පන්තිකාමරය භාවිත කරමින් පවත්වන ලද මාර්ගගත තෝරගැනීමේ පරීක්ෂණයක් සඳහා ශිෂ්‍යයෝ මුහුණදුන් හ.
- Google Form භාවිත කරමින් අයදුම්පත් ලබාගත් අතර, මාර්ගගත වීඩියෝ සම්මුඛ පරීක්ෂණයක් ඔස්සේ Google Classroom භාවිත කරමින් පවත්වන ලද මාර්ගගත තෝරාගැනීමේ පරීක්ෂණයකට ශිෂ්‍යයෝ මුහුණ දුන් හ. ඉන් අනතුරුව, ශිෂ්‍යයින් සඳහා මාර්ගගත ආරම්භක උත්සවයක් සහ ඉගෙනුම් නම්නීකරණ වැඩසටහනක් පවත්වන ලදී.

  අයදුම්පත් 139ක් නිකුත් කරන ලදී.
  මාර්තු 14 දිනට සැලසුම් කරන ලද තෝරාගැනීමේ පරීක්ෂණය සෞඛ්‍ය අවදානම හේතුවෙන් කල් දමන ලදී.
  මාර්ගගත තෝරාගැනීමේ පරීක්ෂණයක් 2020 මැයි මාසයේ 31වන දින පවත්වන ලදී.
  මාර්ගගත සම්මුඛ පරීක්ෂණ 2020 ජුනි මාසයේ 06වන දින පවත්වන ලදී.
  මාර්ගගත ශිෂ්‍ය උපදේශනයද සහිතව ජුලි මාසයේ 20වන දින ලියාපදිංචි කිරීම සිදු කරන ලදී.
  ශිෂ්‍යයින් 32දෙනෙකු ලියාපදිංචි කරන ලදී.

- කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රමාද වූ ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව එම වසරේ පසුකාලයකදී පවත්වන ලදී. අගුලුදැමීම ලිහිල් කිරීම හේතුවෙන් එය පුද්ගල සහභාගිත්වයෙන් එළිමහනේදී පවත්වන ලද උත්සවයක් විය.

  ශිෂ්‍ය උපදේශනය හා හඳුන්වාදීමේ සැසියක් ද සමඟ 2020 ජුනි මාසයේ 26වන දින පුද්ගල සහභාගිත්වයෙන් ආරම්භක උත්සවය හා ලියාපදිංචි කිරීම සිදු කරන ලදී.
  ශිෂ්‍යයින් 45දෙනෙකු ලියාපදිංචි කරන ලදී.
  අගෝස්තු මාසයේ 15වන දින මාර්ගගතව දේශන ආරම්භ කරන ලදී.

- දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා ඔක්තෝබර් මාසයේදී මාර්ගගතව ලියාපදිංචි කිරීම සිදු කරන ලදී.

  2020 ජුලි මාසයේ 13වන දින සිට අගෝස්තු මාසයේ 28වන දින දක්වා අයදුම්පත් කැඳවන ලදී.
  අයදුම්පත් 72ක් නිකුත් කරන ලද අතර, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නාවල ශාඛාවේදී තෝරාගැනීමේ පරීක්ෂණය සඳහා 68දෙනෙකු සහභාගි වූ හ.
  ශිෂ්‍යයින් 42දෙනෙකු ලියාපදිංචි කරන ලදී.
  2020 ඔක්තෝබර් මාසයේ 23වන දින මාර්ගගත ලියාපදිංචි කිරීම හා නම්නීකරණය සිදු කරන ලදී.

- පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රතිව්‍යුහගතකරන ලද දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය දෙමුහුම් ක්‍රමයට අනුව සිදු කරන ලදී. මෙම වැඩසටහන මාර්ගගතව ප්‍රවර්ධනය කිරීමෙන් අනතුරුව, තෝරාගැනීමේ පරීක්ෂණය පුද්ගල සහභාගිත්වයෙන් යුතුව පවත්වන ලදී.

  2020 ජූලි මාසයේ **20**වන දින සිට සැප්තැම්බර් මාසයේ **04**වන දින දක්වා අයදුම්පත් කැඳවන ලදී. අයදුම්පත් **283**ක් නිකුත් කරන ලදුව, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නාවල ශාඛාවේ පැවැති තෝරාගැනීමේ පරීක්ෂණයක් සඳහා **221**දෙනෙකු සහභාගි වූ අතර, එක් අයදුම්කරුවෙක් මාලදිවයිනේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේදී මෙම පරීක්ෂණය සඳහා මුහුණ දුන්නේය.
  ශිෂ්‍යයින් **140**දෙනෙකු ලියාපදිංචි කරන ලදී.
  2020 නොවැම්බර් මාසයේ **20**වන දින මාර්ගගත ලියාපදිංචි කිරීම සිදු කරන ලදී.
  අභ්‍යන්තර හා බාහිර කාර්යමණ්ඩලය විසින් මාර්ගගත ශිෂ්‍ය උපදේශනය සිදු කරන ලදී.

මීය අමතරව, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සමාලෝචනයට යටත් වර්ෂය තුළ පහත සඳහන් අධ්‍යයන හා පරිපාලන ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

<u>කෙටි පාඨමාලා</u>

- ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය
  2020 ජනවාරි මාසයේ **18 – 26** දක්වා
- **2020** පෙබරවාරි මාසයේ **29**වන දින සිට සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන රචනය හා පර්යේෂණ ක්‍රම පිළිබඳ කෙටි පාඨමාලාව අඟුලුදැමීම් හා එදිනෙදා කටයුතුවලට බාධාවීම් හේතුවෙන් සැප්තැම්බර් මාසයේදී අවසන් කරන ලදී.

<u>අනුස්මරණ ත්‍යාගයක් සහ පර්යේෂණ ප්‍රදානයක් ස්ථාපිත කිරීම</u>

- දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධියේඉහළම අධ්‍යයන කුසලතාව සඳහා වන ඩොරික් ද සූසා රන් පදක්කම සහ මෙම වැඩසටහන තුළ සිය පර්යේෂණ අදියරට පිවිසෙන දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා සහාය ලබාදීමට පර්යේෂණ ප්‍රදානයක් ද පිහිටුවීම වෙනුවෙන්**2020** සැප්තැම්බර් මාසයේදී, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂකවරිය වූ මහාචාර්ය රිහානා රහීම් මහත්මිය රු.**650,000.00**ක් පරිත්‍යාග කළාය.

<u>සාමාන්‍ය ශාස්ත්‍රීය කටයුතු</u>

- මාර්ගගත වාචික පරීක්ෂණ **10**ක් පවත්වන ලදී.
- දෙසැම්බර් 15වන දින මාර්ගගතව පැවැත්වුණු උපාධි ප්‍රදානෝත්සවය සඳහා ශිෂ්‍යයෝ **27**දෙනෙකු සහභාගි වූහ.
- සැප්තැම්බර් මාසයේදී ආචාර්ය උපාධිය සඳහා ශිෂ්‍යයෙක් ලියාපදිංචි වූයේය.

<u>පරිපාලන කටයුතු හා මූලිකත්වයන්</u>

- මාර්තු මාසයේ **23**වන දින රට සම්පූර්ණයෙන්ම අඟුලුදැමීමකට ලක්කළ හෙයින්, රජය විසින් නියම කරන ලද පරිදි නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම සඳහා වහාම ක්‍රියාමාර්ග ගන්නා ලදී. කාර්යමණ්ඩලයේ සියලුම ප්‍රමුඛ සාමාජිකයින් වෙත ලැප්ටොප්

පරිගණක සහ එහාමෙහා ගෙන යා හැකි දෘඩ තැටි ලබා දුන් අතර, කාර්යමණ්ඩලයේ සාමාජිකයින් අතර වැදගත් ලිපිගොනු හුවමාරු කරගන්නා ලදී.

- බස්නාහිර පළාත තුළ ජීවත් වන නිලධාරින් හට **16/3** සිට **10/05** දක්වා කාලසීමාව නිවසේ සිට වැඩ කරන කාලසීමාව වශයෙන් අනිවාර්ය විය.
- **11/05** සිට ඉදිරියට, අත්‍යවශ්‍ය අවම කාර්යමණ්ඩලය සහභාගිකරවාගනිමින් වැඩකටයුතු පවත්වාගෙන යන ලද අතර, අනෙකුත් සාමාජිකයෝ නිවසේ සිට රාජකාරි ඉටු කළහ.
- නිවසේ සිට රාජකාරි ඉටු කිරීමේ ක්‍රමවේදය පිළිබඳ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සතිපතා මාර්ගගතව කාර්යමණ්ඩලයේ රැස්වීම් පවත්වන ලදී - එවැනි රැස්වීම් **34**ක් පවත්වන ලදී.
- එක් කාර්යමණ්ඩල සාමාජිකයෙකු I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරයට උසස් කරන ලදී.
- එක් කාර්යමණ්ඩල සාමාජිකයෙකු II ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරයට උසස් කරන ලදී.
- III ශ්‍රේණියේ කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙකු මීළඟ ශ්‍රේණිය (II) ශ්‍රේණියට උසස්වීම් ලදී.
- එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක සිය තනතුරේ ස්ථිර කරන ලදී.
- එක් කාර්යාල කාර්ය සහායකවරයෙකු සිය තනතුරේ ස්ථිර කරන ලදී.
- මාර්ගගත ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රමවේදය සඳහා පහසුකම් සැලසීම පිණිස, Business Zoom accounts ප්‍රසම්පාදනය කරන ලදී.

<u>මූල්‍ය</u>

- බාහිර කථිකාචාර්යවරුන් වෙත බැංකුව හරහා මාර්ගගතව මුදල් මාරු කිරීම අරඹන ලදී - මාර්ගගතව එක්දින පාසල්/පන්ති/ඇගයීම් පැවැත්වීම සඳහා ගෙවීම් හා පෙර වසරේ උපචිත ගෙවීම් සකස් කරන ලදී.
- මහජන බැංකුවෙන් නිල මාර්ගගත බැංකුකරණ පහසුකම් සහිත පෝර්ටලය ලබා ගන්නා ලදී.

(ඇ) අභියෝග

ලොව පුරා රටවල මෙන්ම සුවිශේෂිව ශ්‍රී ලංකාවේ ද ආර්ථිකයට මෙන්ම සමාජයටද අහිතකර ලෙස බලපෑම් ඇති කළ කොරෝනා වසංගතය නොතකමින්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට කැපී පෙනෙන ආයතනික සංහිඳියාවකින් යුතුව මෙම අභියෝගය ජයගැනීමට හැකි විය. මාර්ගගත ක්‍රමවේදයට මාරුවීම මගින් අඛණ්ඩව ශාස්ත්‍රීය කටයුතු පවත්වාගෙන යාමට මෙන්ම දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා වාර්තාගත ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචිකරමින්, වාර්තාගත ආදායමක් ඉපැයීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ඇති හැකියාව මගින් මේ බව මැනවින් පෙන්නුම් කරන ලදී.

එසේ වුවද, වසංගත අභියෝගයට මුහුණ දීමට ඇති මෙම හැකියාව නොතකමින්, සාධක ගණනාවක් හේතුවෙන් මෙම ආයතනය යම් අවදානම් තත්ත්වයක පවතී.මෙම වසංගතයේ බලපෑම, සුවිශේෂිව ආර්ථික බලපෑම, දිවයිනටම දැනී යාමට ආරම්භ වූ හෙයින්, විශේෂයෙන්ම **2021** වර්ෂය මෙම ආයතනයට අභියෝගාත්මක වසරක් විය. ආර්ථික දුෂ්කරතාවන් හේතුවෙන් වැඩසටහන් සඳහා ශිෂ්‍යයින්ගේ ඉල්ලුම පහළ වැටීමේ අවදානමක් ඇත. මීට අමතරව, ආයතනය සතුව තවමත් පශ්චාත් උපාධි ශිෂ්‍යයින් **500**කට ආසන්න ප්‍රමාණයක් සමඟ ගණුදෙණු කරන අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයින් **04**දෙනෙක් පමණක් සිටිති. මෙමගින් සුවිශේෂිව අධ්‍යයන කාර්යමණ්ඩලය මත

පීඩනයක් ඇති කරන නමුත් පරිපාලන සහ කාර්යාලීය කාර්යමණ්ඩලය මත ද ඇති කරන පීඩනය සීමිතය. ආයතනය හැරයන කාර්යමණ්ඩල සාමාජිකයෙකු හේතුවෙන් මානව සම්පත්හි හදිසි කඩාවැටීමක් නිර්මාණය විය හැකි බව මෙමගින් අදහස් කෙරෙන අතර, එය ආයතනය කෙරෙහි අහිතකර ලෙස බලපෑම් කළ හැකිය.

(ඇ) අනාගත සැලසුම්

වසංගත තත්ත්වයක් තුළ සමාජ සහ ආර්ථික පසුබෑම වඩාත් පැහැදිලිව පෙනෙන වසරක් ලෙස පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය **2021** වර්ෂය නිරීක්ෂණය කරයි. මෙවැනි තත්ත්වයක් තුළ නව පාඨමාලා හඳුන්වදීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සතුව කිසිදු සැලැස්මක් නොමැත. එසේ වුවද, මාර්ගගතව පාඨමාලා ලබාදීම වෙත සංක්‍රමණය වීමේදී ලද සුවිශේෂී අත්දැකීම් මත, මුහුණට මුහුණ පාඨමාලා පැවැත්වීමට සමගාමීව ආයතනය සඳහා සුවිශේෂී විකල්පයක් ලෙස මාර්ගගතව ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රමවේදය ඉදිරියට ගෙන යාමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සැලසුම් කරයි. පශ්චාත් උපාධි මට්ටමේ උසස් අධ්‍යාපනය හා බැඳි අනාගතය පිළිබඳව ආයතනය නිරීක්ෂණය කරනුයේ, එය බොහෝදුරට දෙමුහුම් ආකෘතියක් අනුගමනය කරනු ලබන ඇති බවත්, සම්පූර්ණයෙන්ම මුහුණට මුහුණ ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රමවේදයට යොමු වීම සිදු නොවනු ඇති බවත් ය. ඊට හේතුවී ඇත්තේ, පශ්චාත් උපාධිය හදාරන බොහෝ ශිෂ්‍යයින් රැකියාවල නියුතු වෘත්තිකයින් වීමත්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් රට පුරා විසිර සිටින ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීම හේතුවෙන්, දෙමුහුම් ක්‍රමය මගින් ලබා දෙන නම්‍යශීලීතාව ඔවුන් ආකර්ෂණය කරගැනීමත් නිසාය.

ඉහත සඳහන් කරුණුවලට අමතරව, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ආවේණික වූ කළමනාකරණ තොරතුරු පද්ධතියක් ලබාගැනීම සඳහා වන ක්‍රියාවලිය ආරම්භ කිරීමට ආයතනය අපේක්ෂා කරන අතර, ආයතනයේ වැඩිදියුණුවන පාඨමාලා සහ ශිෂ්‍ය තොරතුරු හේතුවෙන් එය දැඩි අවශ්‍යතාවකි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සඳහා සංවර්ධනය කෙරෙමින් පවතින කළමනාකරණ තොරතුරු පද්ධතියෙන් ආයතනයට සුවිශේෂී ක්‍රමවේදයක් ලබාගැනීම සඳහා මේවන තෙක් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය එම විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය සමඟ සාකච්ඡා මාලාවක් පවත්වා ඇත. මෙම ප්‍රසම්පාදනය සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය විසින් අවස්ථා දෙකකදී මෙම නව පද්ධතියේ ලක්ෂණ පිළිබඳව පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩලයට හා පාලක මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීමේ මොඩියුලය වැනි නව පද්ධතියේ කොටස් දැනටමත් ක්‍රියාත්මක කර ඇත.

(ඉ) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පවත්වන පාඨමාලා හා ශිෂ්‍යයින්ගේ විස්තර

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මගින් පිරිනමන අධ්‍යාපනික පාඨමාලාවල සවිස්තරාත්මක පැහැදිලිකිරීමක් හා මෙම පාඨමාලා සඳහා බඳවාගෙන ඇති ශිෂ්‍යයින්ගේ සංඛ්‍යා දත්ත පහත සඳහන් පරිදි වේ:

පූර්ණ කාලීන පාඨමාලා

අ. පර්යේෂණ මගින් සිදු කරන පශ්චාත් උපාධි පාඨමාලා

1. දර්ශනශූරී උපාධිය
2. දර්ශනපති උපාධිය

ආ. පර්යේෂණ නොවන ලිඛිත මාධ්‍ය මෙන්ම පර්යේෂණ අංග ද ඇතුලත් පශ්චාත් උපාධි

3. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
4. දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

ඇ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන්

1. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
2. දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
3. ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
4. ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

එක් එක් වැඩසටහන සඳහා ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව

වැඩසටහන	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව
දර්ශනශූරී උපාධිය	**01**
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය **(MA in TESL)**	**75**
දෙවනබසක් ලෙසඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති උපාධිය **(PG Dip./MA in TESL)**	**210**
දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය **(MATLSC)**	**107**
ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව **(PGDipBE)**	**84**
ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	**45**
මුළු එකතුව	**522**

අධ්‍යයන වර්ෂ මඟින් වෙන්කරන ලද පූර්ණකාලීන වැඩසටහන්වලට සම්බන්ධ වී සිටින ශිෂ්‍යයින්ගේ විස්තර

පාඨමාලාව	ඇතුලත් කරගැනීම් 2019	පළමු වසරේ ශිෂ්‍යයින් (I කොටස)	දෙවන වසරේ ශිෂ්‍යයින් (II කොටස)	උපාධිය ලත් සංඛ්‍යාව
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ ශාස්ත්‍රපති උපාධිය	**140**	**70**	**75**	පශ්චාත් උපාධි ඩිප්ලෝමාව – **07** ශාස්ත්‍රපති උපාධිය – **17**
දෙවන බස පසුබිමක් තුල ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	**42**	**42**	**23**	පශ්චාත් උපාධි ඩිප්ලෝමාව – **01** ශාස්ත්‍රපති උපාධිය –

					01
ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව		**-**	**44**	**40**	**පශ්චාත් උපාධි ඩිප්ලෝමාව – 41**
ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව		**32**	**13**	**-**	**-**
මුළු එකතුව	**04**	**214**	**169**	**138**	**පශ්චාත් උපාධි ඩිප්ලෝමාව – 49 ශාස්ත්‍රපති උපාධිය - 18**

කෙටි පාඨමාලා

පාඨමාලාව	**කාලසීමාව**	**ලියාපදිංචි වූ ශිෂ්‍යයින් සංඛ්‍යාව**	**අවසන් කරන ලද ශිෂ්‍යයින් සංඛ්‍යාව**
ගුණාත්මක දත්ත විශ්ලේෂණය	**පැය 21**	**14**	**14**
ශාස්ත්‍රීය රචනා	**පැය 32**	**36**	**25**
මුළු එකතුව			

ශිෂ්‍ය කාර්යසාධනය – 2018/2019

පහත දැක්වෙනුයේ, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පවත්වනු ලබන පූර්ණකාලීන වැඩසටහන්හි ශිෂ්‍යයින් විසින් පාඨමාලාමය වශයෙන් පෙන්නුම් කර ඇති කාර්යසාධනය පිළිබඳ විස්තර ය.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය දුරස්ථ + මුහුණට මුහුණ වශයෙන් මිශ්‍රිත අධ්‍යාපන ක්‍රමවේදයක් අනුගමනය කරන හෙයින්, ලියාපදිංචි වූ දිනයේ සිට වසර 06ක් දක්වා කාලයක් තුල සිසුන්ට පාඨමාලාවක් සම්පූර්ණ කළ හැකිය. මෙය දුරස්ථ අධ්‍යාපන ක්‍රමයට ආවේණික නම්‍යශීලීබවෙහි අංගයකි. එම නිසා, උපාධිය සම්පූර්ණ කරන ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා, තමන් නියම වශයෙන් ලියාපදිංචි වී ඇති පාඨමාලා සම්පූර්ණ කරන ශිෂ්‍යයින්ගේ සංඛ්‍යාව මගින් ශිෂ්‍යයින්ගේ හා ආයතනයේ කාර්යසාධනය පිළිබඳ වඩා යහපත් දර්ශකයක් ලබා දෙයි.

වගුව 1 – අවසන් ඇගයීම්හිදී ශිෂ්‍ය කාර්යසාධනය 2019/2021
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති උපාධිය – PGDip (TESL)

පාඨමාලා කේත අංකය	ලියාපදිංචි වූ (අ)	සුදුසුකම් ලත් (ආ) (ආ/අ%)	මුහුණ දුන් (ඇ) (ඇ/ආ%)	සමත් වූ (ඈ) (ඈ/ඇ%)	අවසන් කරන ලද අනුපාතය (ඈ/ආ%)
ELP1301	**59**	**42 (71.1%)**	**41 (97.6%)**	**41 (100%)**	**97.6%**
ELP1201	**60**	**48 (80%)**	**43 (89.6%)**	**42 (97.7%)**	**87.5%**
ELP1202	**63**	**51 (81%)**	**46 (90.2%)**	**46 (100%)**	**90.2%**
ELP1203	**69**	**50 (72.4%)**	**47 (94%)**	**47 (100%)**	**94%**
ELP1101	**63**	**50 (79.4%)**	**44 (88%)**	**44 (100%)**	**88%**
ELP1102	**62**	**49 (73.03%)**	**40 (82.63%)**	**40 (100%)**	**61.63%**
ELP1103	**27**	**19 (70.3%)**	**17 (89.4%)**	**17 (100%)**	**89.47%**
ELP1104	**14**	**10 (71.42%)**	**08 (80%)**	**08 (100%)**	**80%**
ELP1105	**27**	**19 (70.37%)**	**17 (89.4%)**	**17 (100%)**	**89.47%**
ELP2101	**45**	**43 (95.6%)**	**40 (93%)**	**40 (100%)**	**93%**
ELP2102	**44**	**39 (88.6%)**	**38 (97.4%)**	**38 (100%)**	**97.4%**
ELP2301	**10**	**08 (80%)**	**08 (100%)**	**08 (100%)**	**100%**

වගුව 2 – අවසන් ඇගයීම්හිදී ශිෂ්‍ය කාර්යසාධනය 2019/2020

දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - පැරණි විෂය නිර්දේශය

පාඨමාලා කේත අංකය	ලියාපදිංචි වූ (අ)	සුදුසුකම් ලත් (ආ) (ආ/අ%)	මුහුණ දුන් (ඇ) (ඇ/ආ%)	සමත් වූ (ඈ) (ඈ/ඇ%)	අවසන් කරන ලද අනුපාතය (ඈ/ආ%)
LTP1201	**01**	**00 (0%)**	**00 (0%)**	**00 (0%)**	**0%**
LTP1202	**03**	**02 (66.7%)**	**02 (100%)**	**02 (100%)**	**100%**
LTP1101	**01**	**01 (100%)**	**00 (0%)**	**00 (0%)**	**0%**
LTP1102	**04**	**03 (75%)**	**02 (66.7%)**	**02 (100%)**	**66.7%**
LTP1103	**04**	**02 (50%)**	**02 (100%)**	**02 (100%)**	**100%**
LTP1104	**02**	**01 (50%)**	**00 (0%)**	**00 (0%)**	**0%**
LTP1105	**00**	**00 (0%)**	**00 (0%)**	**00 (0%)**	**0%**
LTP1203	**02**	**02 (100%)**	අපේක්ෂිත	**-**	**-**
LTP1204	**02**	**02 (100%)**	**01 (50%)**	**01 (100%)**	**50%**
LTP1106	**06**	**06 (100%)**	අපේක්ෂිත	**-**	**-**
LTP1107	**02**	**02 (100%)**	**02 (100%)**	**02 (100%)**	**100%**
LTP2101	**05**	**05 (100%)**	**05 (100%)**	**05 (100%)**	**100%**
LTP2102	**04**	**04 (100%)**	**03 (75)**	**03 (100%)**	**75%**
LTP2103	**05**	**05 (100%)**	**04 (80%)**	**04 (100%)**	**80%**

වගුව 3 - අවසන් ඇගයීම්හිදී ශිෂ්‍ය කාර්යසාධනය 2019/2020

දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - නව විෂය නිර්දේශය

පාඨමාලා කේත අංකය	ලියාපදිංචි වූ	සුදුසුකම් ලත්	මුහුණ දුන්	සමත් වූ	අවසන් කරන ලද අනුපාතය (ඇ/ආ%)
PGP8304	**25**	**22 (88%)**	**21 (95.5%)**	**21 (100%)**	**95.5%**
PGP9401	**27**	**25 (92.6%)**	**23 (92%)**	**23 (100%)**	**92%**
PGP8101	**22**	**22 (100%)**	**20 (90.9%)**	**20 (100%)**	**90.9%**
PGP9402	**30**	**26 (86.6%)**	**23 (88.4%)**	**21 (91.3%)**	**80.7%**
PGP8306	**27**	**24 (88.88%)**	**23 (95.83%)**	**23 (100%)**	**95.83%**
PGP9501	**23**	**20 (86.95%)**	**20 (100%)**	**20 (100%)**	**100%**
PGP9301	**28**	**25 (89.28%)**	අපේක්ෂිත	**-**	**-**
PGP8305	**34**	**32 (94.1%)**	**27 (84.4%)**	**27 (100%)**	**84.4%**
PGP9403	**28**	**24 (85.71%)**	අපේක්ෂිත	**-**	**-**
PGPA601	**03**	**03 (100%)**	**03 (100%)**	**03 (100%)**	**100%**
PGPA401	**03**	**03 (100%)**	**03 (100%)**	**03 (100%)**	**100%**

වගුව **4 -** අවසන් ඇගයීම්හිදී ශිෂ්‍ය කාර්යසාධනය **2019/2020**

ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

පාඨමාලා කේත අංකය	ලියාපදිංචි වූ	සුදුසුකම් ලත්	මුහුණ දුන්	සමත් වූ	අවසන් කරන ලද අනුපාතය (ඇ/ආ%)
PGP8501	**67**	**56 (83.6%)**	**53 (94.6%)**	**51 (96.2%)**	**91.1%**
PGP8401	**67**	**62 (92.5%)**	**53 (85.5%)**	**53 (100%)**	**85.5%**
PGP8302	**67**	**55 (82.1%)**	**54 (98.2%)**	**54 (100%)**	**98.2%**
PGP8601	**67**	**58 (86.6%)**	**54 (93.1%)**	**49 (90.7%)**	**84.3%**
PGP8301	**67**	**57 (85.1%)**	**51 (89.5%)**	**51 (100%)**	**89.5%**
PGP8303	**67**	**53 (79.1%)**	**53 (100%)**	**53 (100%)**	**100%**
PGP8602	**42**	**30 (71.4%)**	**29 (96.7%)**	**29 (100%)**	**96.7%**
PGP8603	**25**	**24 (96%)**	**24 (100%)**	**24 (100%)**	**100%**

පාඨමාලා කේත අංකය	ලියාපදිංචි වූ	සුදුසුකම් ලත්	මුහුණ දුන්	සමත් වූ	අවසන් කරන ලද අනුපාතය (ඇ/ආ%)
PGP8307	**40**	**38 (95.0%)**	**36 (94.7%)**	**36 (100%)**	**94.7%**
PGP8607	**40**	**36 (90.0%)**	**35 (97.2%)**	**33 (94.3%)**	**94.2%**
PGP8308	**40**	**37 (92.5%)**	**36 (97.3%)**	**36 (100%)**	**97.3%**
PGP8309	**40**	**37 (92.5%)**	**36 (97.3%)**	**34 (94.4%)**	**91.9%**
PGP8310	**40**	**37 (92.5%)**	**36 (97.3%)**	**33 (91.7%)**	**89.2%**
PGP8502	**40**	**38 (95.0%)**	ඇගයීම තවමත් සිදු කෙරෙමින් ඇත	**-**	**-**
PGP8311	**40**	ඇගයීම තවමත් සිදු කෙරෙමින් ඇත	**-**	**-**	**-**
PGP8402	**40**	ඇගයීම තවමත් සිදු කෙරෙමින් ඇත	**-**	**-**	**-**

ඉගෙනුම්ලාභියා වෙත ලැබෙන සහාය

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිය යෝජනා ඉදිරිපත් කිරීමට සූදානම් වන පර්යේෂණ සිදු කරනු ලබන ශිෂ්‍යයින් වෙනුවෙන් එම ශිෂ්‍යයින් සමඟ මාර්ගගතව සාකච්ඡා පවත්වා, ප්‍රතිපෝෂක ලබා දෙන ලදී. මෙය කාලය හා බද්ධ වූ ක්‍රියාවක් මෙන්ම එකිනෙකට වෙනස් ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් දෙකක් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු හෙයින්, වඩාත් අවධානය යොමු කරන ලද උසස් මට්ටමේ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයින්ට සහාය ලබාදීමේදී එය සාර්ථක උපායමාර්ගයක් බව සනාථ කර ඇත.

(ඊ) සමාලෝචනයට යටත් වර්ෂය තුල සිදු කරන ලද ක්‍රියාකාරකම්හි විස්තර

පූර්ණකාලීන හා කෙටිකාලීන පාඨමාලා හැර, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන ක්‍රියාකාරකම් පහතින් දැක්වේ. එම ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි විස්තරයක් පහතින් දැක්වේ.

විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසි වාරයන්හි පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පර්යේෂණ මණ්ඩලය - 2020 (OURS 2020)

වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වසරේදී මාර්ගගතව පවත්වන ලද 2020 විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසිවාරයේදී (OURS 2020) පර්යේෂණ මණ්ඩලයක් මෙහෙයවීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ආරාධනා කෙරිණි. මෑතකදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයෙන් දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලත් උපාධිධාරීන් 05දෙනෙක් මෙම මණ්ඩලය නියෝජනය කළහ. ඊට අතිරේකව, 2020 නොවැම්බර් මාසයේ 12 සිට 13 දක්වා පවත්වන ලද OURS 2020හිදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍යයෝ 15දෙනෙක් “ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම”යන මැයෙන් වූ උප තේමාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළහ.

පර්යේෂණ සාකච්ඡා

සාමාන්‍යයෙන්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිය ශාස්ත්‍රපති පාඨමාලා දෙක සඳහා පර්යේෂණ සංසද පවත්වනු ලබන අතර, එහිදී ශිෂ්‍යයින් විසින් සිය පර්යේෂණ යෝජනා ඉදිරිපත් කරන්නාක් සේම විශේෂඥ මණ්ඩලයක් මගින් ඒවා ඇගයීමට ලක් කෙරේ. එසේ වුවද, කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ බාධාවන් නිසා මෙම පර්යේෂණ සංසද මාර්ගගත පර්යේෂණ සාකච්ඡා බවට පත් කළ අතර, එහිදී ශිෂ්‍යයින් වෙත සිය යෝජනා පිළිබඳ ප්‍රතිපෝෂක ලබා දුන් අතර, එකී යෝජනා සාම්ප්‍රදායික ඇගයීම් ලෙස අගයන ලදී.

දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා මාර්ගගත පර්යේෂණ සාකච්ඡාව අප්‍රේල් මාසයේ 27වන දින පවත්වන ලද අතර, දෙවන බසක් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි සාකච්ඡා සංසදය නොවැම්බර් මාසයේ 25වන දින පවත්වන ලදී.

වෙනත් අගය එකතු කළ ක්‍රියාකාරකම්

- දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා තෝරාගැනීමේ පරීක්ෂණයට පෙර සිය ගැටලු නිරාකරණය කරගැනීම පිණිස, එම පාඨමාලාව වෙනුවෙන් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සුදුසුකම් සහිත අපේක්ෂකයින් සඳහා 'open day' වැඩසටහනක් මාර්ගගතව පවත්වන ලදී. පූර්ව පාඨමාලා ක්‍රියාකාරකම්වලට අනුව, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට මෙය ‘පළමු අදියරක්’ විය.
- ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව වෙනුවෙන්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය සමඟ හවුල්කාරිත්වයක් ඇති කරගත් අතර, C-DELTA වැඩසටහන පිරිනමන ලදී. ද්වීභාෂා අධ්‍යාපන ගුරුවරුන් 17දෙනෙකු Commonwealth of Learning ආයතනය මගින් අරමුදල් සපයන ලද තුන් දින වැඩමුළුවක් සම්පූර්ණ කරන ලදී.

(ඵ) මානව සම්පත්

දැනට ආයතනය සතුව පහත සඳහන් මානව සම්පත් පවතී.

අධ්‍යයන කාර්යමණ්ඩලයේ විස්තර

ආයතනය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	පරිවාස කාලසීමාවේ සිටින කථිකාචාර්ය	උපදේශකවරුන්
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය	ඉංග්‍රීසි	-	01	03	-	-	01*
මුළු	-	-	01	03	-	-	01

* කොන්ත්‍රාත් පදනම මත කථිකාචාර්ය

අනධ්‍යයන කාර්යමණ්ඩලයේ විස්තර

ආයතනය	ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය	කණිෂ්ඨ කාර්යමණ්ඩලය	සුළු සේවකයින්
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය	-	02	05	02
මුළු	-	02	05	02

මුළු කාර්යමණ්ඩලය - 14

(අධ්‍යයන කාර්යමණ්ඩලයේ 5දෙනෙකු සහ පරිපාලන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ 9දෙනෙකු)

(ඌ) කාර්යමණ්ඩලයේ පර්යේෂණ, නව සොයාගැනීම් හා ප්‍රකාශන

<u>සහරා ලිපි</u>

Herath, S.M., 2020. The impact of language learning experiences on language teachers' professional practices: a case study of two language biographies. Sri Lanka Journal of Social Sciences, 43(2), pp.73–84. DOI: http://doi.org/10.4038/sljss.v43i2.7952

Ranasuriya, D.L. and Herath, S.M., 2020. A Needs Analysis on the language skills required by the industry from vocational graduates. Sri Lanka Journal of Social Sciences, 43(2), pp.85–98. DOI: http://doi.org/10.4038/sljss.v43i2.7932

Herath, S., (2020). Inclusivity and Diversity in ELT Material: Critical Textual Analysis as a Pedagogical Tool. *OUSL Journal*, 15(1), pp.7–25. DOI: http://doi.org/10.4038/ouslj.v15i1.7470

Herath, S. (2020): The discursive construction of ethnic hierarchies in textbooks in a time of post-conflict reconciliation, *Compare: A Journal of Comparative and International Education*, DOI: 10.1080/03057925.2019.1709804

Seneviratne, S. K. (2020). Rethinking the 'good receipt' in All's Well That Ends Well. *Essays in Criticism 70*(2), 160–177. DOI https://doi.org/10.1093/escrit/cgaa003

ග්‍රන්ථ පරිච්ඡේද හා සංස්කරණය කළ වෙළුම්

Rambukwella, Harshana. 2020. "The representational burden of ethno-nationalist violence in Sri Lanka"in*Violence in South Asia: Contemporary perspectives*, ed., Pavan Kumar Malreddy, Anindya Sekhar Purakayastha, BirteHeideman. New York: Routledge. doi.org/10.4324/9780429316845

Valencia, M., Herath, S. & Gagné, A. (2020). Unpacking professional identity: The use of multimodal identity texts and duoethnographies in language teacher education. In Yazan, B. & Lindahl, K (Eds.) *Language Teacher Identity in TESOL: Teacher Education and Practice as Identity Work*. Oxford: Taylor & Francis.

සම්මන්ත්‍රණවලදී ඉදිරිපත් කිරීම්

Herath, S. Goonawardena, G., Nawaz, N., Aiyer, RK., Rathnasiri, O. (2020). Doing research in times of change – Insights from research in teaching and learning English language and literature. *Open University Research Symposium (OURS 2020),* Colombo: Sri Lanka.

Seneviratne, S. K. (2020, November 5-7). *Ariel's bodies in the RSC Tempest (2016)* [Conference presentation]. *Intersections in Shakespeare*, Asian Shakespeare Association, Seoul, South Korea.

Wijesekara, H.D. Is going 'online' a panacea for teaching/learning: Risking equity and inclusion in the time of the lockdown presented at the Two-day International Online Conference on Teaching-Learning in the time of pandemic: Role of online learning, 2020 April 21-22, Commonwealth Education Media Centre for Asia and Krishna KantaHandiqui State Open University, Guwahati, Assam India.

Wijeskara, H.D. "Assessments for Learning and promoting 21st-century skills through Alternative Assessments in the English Language classrooms" Online presentation at the

Association for Language Testing and Assessment of Australia and New Zealand (ALTAANZ/LTRC 2020) November 19-20, 2020, University of Melbourne.

පර්යේෂණ වාර්තා සහ වෙනත් විද්‍යාත්මක සන්නිවේදනය කිරීම්

Rambukwella, Harshana. 2020. “Patriotic science: The corona virus pandemic, nationalism and indigeneity.” Political Geography Blog, University of Zurich https://www.geo.uzh.ch/en/units/pgg/Blogging-political-geography/Pirit-Pan-Ceremony.html

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මගින් එම විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩලය සඳහා පවත්වන ලද වැඩසටහන් සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ඉගැන්වීම්, ඇගයීම් හා සම්බන්ධීකරණ සහාය ලබා දෙන ලදී. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩලය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශය හා කොළඹ, කැලණිය, ශ්‍රී ජයවර්ධනපුර හා යාපනය යන විශ්වවිද්‍යාලවල ඉංග්‍රීසි අධ්‍යයනාංශ වෙත ඉගැන්වීම්, ඇගයීම්, අධීක්ෂණ හා පරීක්ෂණ සහාය ද ලබා දෙන ලදී. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩලය විසින් ජාතික විශ්වවිද්‍යාල ගණනාවක සම්මන්ත්‍රණ සහ සමුළු සඳහා ද සහාය ලබා දෙන ලදී. ජාතික අධ්‍යාපන ආයතනය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉංග්‍රීසි සහ විදේශ භාෂා අධ්‍යයනාංශය සහ එම අමාත්‍යාංශයේ ද්විභාෂා අධ්‍යාපන ඒකකය ද පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ විශේෂඥ දැනුමෙන් ප්‍රතිලාභ ලැබූ හ. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයෝ වෙනත් ජාතික විශ්වවිද්‍යාලවල කමිටුවල සහ මණ්ඩලවල ද, රාජ්‍ය සාහිත්‍ය මණ්ඩලය හා ග්‍රේෂන් භාරය වැනි විවිධ ජාතික ආයතනවල හා ජාතික විශ්වවිද්‍යාලවල AHEAD ව්‍යාපෘතිවල ද සේවය කළහ.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයෝ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යයන්හි විවිධ අංශ වෙත සහාය ලබාදීම දිගින් දිගටම සිදු කළහ. මෙම සහාය නොමැතිව ශාස්ත්‍රපති උපාධි මට්ටමේ පර්යේෂණ අධීක්ෂණය කිරීම අපහසු කාර්යයක් වීමට තිබූ අතර, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ කාර්යමණ්ඩලය සූදානම්සහගතව හා උනන්දුවෙන් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ කාර්යයන් සඳහා සහාය ලබා දී ඇත.

2020 වර්ෂය පුරාවටම, බොහෝ තනි පුද්ගලයින් මෙන්ම උපකුලපතිතුමා, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පීඨ සභාවේ සාමාජිකයින්, නියෝජ්‍ය උපකුලපතිතුමා, ලේඛකාධිකාරිතුමා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා සහ අධ්‍යාපන පීඨයන්හි පීඨාධිපතිවරුන්, මූල්‍යාධිකාරිතුමා පුස්තකාලයාධිපතිතුමා හා පුස්තකාලයේ කාර්යමණ්ඩලය, අධ්‍යාපන පීඨයේ සහකාර ලේඛකාධිකාරිවරුන් හා අධ්‍යාපන තාක්ෂණවේද අංශයේ අධ්‍යයන කාර්යමණ්ඩලය ඇතුලු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ආයතන මගින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත සහාය ලබා දෙන ලදී.

මහාචාර්ය එච්.එස්. රඹුක්වැල්ල
අධ්‍යක්ෂක
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

3. කළමනාකරණ හා පරිපාලන ප්‍රගතිය

මෙම කොටස මගින් සමාලෝචනයට යටත් වර්ෂය තුළ කළමනාකරණය හා පරිපාලනය ආශ්‍රිත කටයුතු පිළිබඳ කෙටි සාරාංශයක් ඉදිරිපත් කෙරේ.

- කෝවිඩ් 19 වසංගත තත්ත්වයට ප්‍රතිචාර ලෙස පනවන ලද අගුලුදැමීම් සහ සාමාන්‍ය කාර්යාලීය වැඩකටයුතුවලට මහත්සේ බාධා ඇතිවීම හේතුවෙන්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පරිපාලනය මගින් වැඩකටයුතු මාර්ගගතව සිදු කිරීම සඳහා ක්‍රියාකාරී පියවර ගන්නා ලදී.
- මෙම ක්‍රියාමාර්ගය සඳහා පහසුකම් සැලසීම පිණිස, ප්‍රධාන පෙලේ පරිපාලන හා කාර්යාලීය කාර්යමණ්ඩලය අතර ආයතනය සතු සියලුම ලැප්ටොප් පරිගණක හා ජංගම අන්තර්ජාල සබඳතා සහිත උපකරණ බෙදාහරින ලදී.
- කාර්යමණ්ඩලය විසින් නිවසේ සිට සිදු කරන වැඩකටයුතු පිළිබඳයාවත්කාලීන කිරීමට හා අධීක්ෂණය කිරීමටසතිපතා මාර්ගගත රැස්වීම් පවත්වන ලද අතර,Google Workspaceපුළුල් ලෙස භාවිතය -කාර්යයන් පහසුකිරීම උදෙසා Google Drive, Docs, Spreadsheets සහ Google Formsයනාදිය භාවිත කරන ලදී.
- එසේම, අභ්‍යන්තර කාර්යමණ්ඩලය විසින් සියලුම කාර්යමණ්ඩලය වෙත Google Meet, Zoom සහ Google Workspaceභාවිතය පිළිබඳ මාර්ගගත නම්නීකරණ වැඩසටහනක් පවත්වන ලදී.
- ආයතනය සතුව කළමනාකරණ තොරතුරු පද්ධතියක් නොමැති වුවද, මාර්ගගතව අයදුම්පත් එක්රැස්කර, ලියාපදිංචි කිරීම සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් SAR හි මගපෙන්වීම යටතේ Google Formsද භාවිත කරන ලදී.
- වසංගතය හා බාහිර කාර්යමණ්ඩලය හා ශිෂ්‍යයින් හට ආයතනයට පැමිණීමට නොහැකිවීම හේතුවෙන්, පශ්චාත් උපාධි ආයතනය නුගේගොඩ මහජන බැංකුව සමඟ පුළුල්ව සාකච්ඡා පවත්වා, පුද්ගල මුණගැසීම්වලින් තොරව බැංකු කටයුතු සිදු කිරීම (contactless banking) සඳහා පහසුකම් සැලසීම පිණිස මුදල් හුවමාරු කිරීම් හා මාර්ගගත ආයතනික බැංකුකරණය සඳහා අවකාශය සලසන ලදී.

යටිතල පහසුකම්වල ප්‍රගතිය

ගෘහභාණ්ඩ, උපකරණ හා වෙනත් වත්කම් අත්පත්කරගැනීම

කිසිදු ගෘහභාණ්ඩයක් හෝ උපකරණයක් මිලදී නොගත් අතර, 2020 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කිසිදු ප්‍රාග්ධන වියදම් වෙන්කිරීමක් සිදු නොකරන ලදී.

2020 වර්ෂය තුළ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත සහාය ලබා දුන් බාහිර කාර්යමණ්ඩලය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ වෙනත් ජාතික විශ්වවිද්‍යාලවල අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය ලබාදුන් සහාය පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය කෘතඥපූර්වකව සිහි කරයි. මීට අමතරව, ආයතනයේ පාඨමාලා සහ වැඩසටහන් ලබාදීමේදී විශ්වවිද්‍යාල පද්ධතියෙන් බැහැර වෘත්තිකයින් ගණනාවක් විසින් ලබාදුන් සහාය ද පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සිහි කරයි. මෙම සහාය නොවන්නට, ආයතනයට මෙසේ කටයුතු කිරීමට අපහසු වනු නොඅනුමානය.

මාර්ගගත ක්‍රමයට සංක්‍රමණය වීමට හැකි වන පරිදි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය විසින් ලබා දුන් සහාය මෙන්ම මෙම නව මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදවලට ඉතා ඉක්මණින් අනුගත වූ සියලුම බාහිර කථිකාචාර්යවරුන් සිහි කිරීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සුවිශේෂිව කැමැත්ත පල කරයි. සිය විවිධත්වයෙන් යුතු හා පුළුල් වන ශිෂ්‍ය ප්‍රජාව වෙත උසස් තත්ත්වයේ සේවාවක් ලබාදීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකි බව මෙම සහාය මගින්ද තහවුරු කෙරේ.

4. තිරසර සංවර්ධනය පිළිබඳ අනාගත අපේක්ෂාවන්

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සිය කාර්යයන්වලට සෘජුවම අදාල පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඇත:

අරමුණු **4** - ගුණාත්මකබවින් යුතු අධ්‍යාපනය
අරමුණු **16** - සාමය, යුක්තිසහගතබව හා ශක්තිමත් ආයතන

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යයන් සම්බන්ධ කර ඇති හා එම අරමුණු දෙක සඳහා දායක වී ඇති සුවිශේෂී ආකාර පහතින් දැක්වේ:

<u>අරමුණු **4** - ගුණාත්මකබවින් යුතු අධ්‍යාපනය</u>

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වැඩ කටයුතු මගින් අරමුණ **4** යටතේ පහත සඳහන් ඉලක්ක ළඟාකරගැනීමට උත්සාහ කර ඇත.

1. **2030** වර්ෂය වන විට, සේවා නියුක්තිය, සුදුසු රැකියා හා ව්‍යවසායකත්වය සඳහා තාක්ෂණික හා වෘත්තිය නිපුණතා කුසලතා ඇතුලු අදාල කුසලතා සතු තරුණ හා වැඩිහිටි පිරිසගේ සංඛ්‍යාව සැලකිය යුතු වශයෙන් ඉහළ නැංවීම.

2. **2030** වන විට, අධ්‍යාපනය තුල ස්ත්‍රී-පුරුෂ අසමානතා ඉවත් කිරීම හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්, ආදිවාසීන් හා අවදානම් තත්ත්වයන්හි පසුවන දරුවන් ඇතුලු අවදානම්සහගත කොටස්වාස සඳහා සියලු මට්ටමහි අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශය ලබාදීම තහවුරු කිරීම.

3. **2030** වන විට, සුවිශේෂී ලෙස අවම වශයෙන් සංවර්ධිත රටවල්හි මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල්හි හා සංවර්ධනය වෙමින් කුඩා දිවයින් රාජ්‍යයන්හි ගුරු පුහුණුව ලබාදීම සඳහා ජාත්‍යන්තර සහයෝගිතාව හරහා සුදුසුකම්ලත් ගුරුවරුන් ලබාදීම සැලකිය යුතු වශයෙන් ඉහළ නැංවීම.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මෙම අරමුණුවලට දායකත්වය දැක්වූ ආකාරය:

1. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දැනට ක්‍රියාත්මක වන ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් දෙක: දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ දෙවන බස

පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය මගින් අරමුණු 1 හා 3 කෙරෙහි අවධානය යොමු කර ඇත.

මෙම වැඩසටහන් දෙකේම ප්‍රාථමික ඉලක්කගත කණ්ඩායම ශ්‍රී ලංකාවේ රාජ්‍ය, පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අධ්‍යාපන අංශවල ගුරුවරු වෙති. ඇතැම් ශිෂ්‍යයින් සේවා නියුක්තිය තහවුරු කරගැනීම සඳහා මෙම ආයතනයේ ශාස්ත්‍රපති උපාධිය භාවිත කර ඇති අතර, ඇතැමුන් රැකියාවේ උසස්වීම් වැනි වෘත්තීය ප්‍රගතිය අත්කරගැනීම සඳහා මෙන්ම විදෙස්ගත වැඩිදුර පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා අයදුම්කිරීම වෙනුවෙන් මෙය භාවිත කර ඇත.මීට අමතරව, 2018 හා 2019 වර්ෂවලදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ගණනාවක් පවත්වන ලද අතර, එමගින් රටේ ඉංග්‍රීසි ගුරුවරුන්ගේ වෘත්තීය ප්‍රගතිය කෙරෙහි අඛණ්ඩ දායකත්වයක් ලබා දී ඇත.

2018 හා 2019 වර්ෂවලදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මගින් ලබා දුන් පශ්චාත් උපාධි අධ්‍යාපන වැඩසටහන්වල අනුගතබව සහ ගුණාත්මකබව තවදුරටත් වැඩිදියුණු කිරීම පිණිස, මෙම ආයතනය විසින් අතිරේක හැරයාම් විකල්ප සහ පැය 100ක පුහුණුකාලයක්ද ස්ථාපිත කරමින් සිය දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මෙම ප්‍රතිව්‍යුහගතකිරීමේ ක්‍රියාවලිය අවසන් කර ඇති අතර, එකී වැඩසටහන 2020 වර්ෂයේදී ආරම්භ කරන ලදී.මෙමගින් වැඩසටහනට පිවිසෙන ගුරුවරුන් වෙත වඩා නම්‍යශීලීබවක් ලබාදෙනුයේ, අත්‍යවශ්‍යයෙන්ම පර්යේෂණ ව්‍යාපෘතියක නියුතුවීමකින් තොරව දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි සුදුසුකමක් සහිතව ඔවුන්ට පිටව යාමට හැකි වන නිසාය.

1. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් නව පශ්චාත්උපාධි ඩිප්ලෝමා වැඩසටහන් දෙක් වැඩිදියුණුකරන ලද අතර, එම වැඩසටහන් 2018 හා 2019 වර්ෂවල සිය පවත්වාගෙන යනු ලැබේ. මෙම වැඩසටහන් දෙකම රට තුළ ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා සෘජුවම දායකත්වය සපයයි.

ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව යනු ශ්‍රී ලංකාවේ ඇති එකම ද්වීභාෂා අධ්‍යාපන වැඩසටහන වන අතර, ඉංග්‍රීසි භාෂාවෙන් සහ සිය මව් භාෂාවෙන් විෂය කරුණු ඉගැන්වීය හැකි නව ගුරු පරපුරක් සංවර්ධනය කිරීම පිණිස, Content Language Integrated Learning (CLIL) ක්‍රමවේදය භාවිත කරයි. මෙමගින් සිය ඉංග්‍රීසි භාෂා දැනුම වැඩිදියුණුකරගැනීමට සෘජුවම ශිෂ්‍යයින් වෙත ප්‍රතිලාභ සපයයි.

ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව මගින් ඉංග්‍රීසි භාෂාව සඳහා සන්නිවේදනය පදනම් කරගත් ප්‍රවේශයක් ලබා දෙන අතර, ඵලදායී සේවා නියුක්තිය අත්කරගනිමින්, සමාජයේ කාර්යක්ෂම පුරවැසියන් බවට පත්වීම සඳහා ඉංග්‍රීසි භාෂාව පදනම් කරගත් සන්නිවේදන කුසලතාළභාකරගැනීම පිණිස, රැකියා අපේක්ෂිත තරුණයින් සහ රැකියාවල නියුතු මුල් අවධියේ වෘත්තිකයින් ඉලක්ක කෙරේ.

1. ප්‍රචණ්ඩත්වය වළක්වා, ත්‍රස්තවාදය හා අපරාධවලට එරෙහිව සටන් කිරීම සඳහා සුවිශේෂිව සංවර්ධනය වෙමින් පවතින රටවල සියලුම මට්ටම්හි ධාරිතා සංවර්ධනය කිරීම වෙනුවෙන් ජාත්‍යන්තර සහයෝගිතාව හරහා අදාල ජාතික ආයතන ශක්තිමත් කිරීම.

2. තිරසර සංවර්ධනය වෙනුවෙන් පුද්ගලයින් හට වෙනස් ආකාරයෙන් නොසලකන නීති හා ප්‍රතිපත්ති බලාත්මක කිරීම.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් බ්‍රිතාන්‍ය කවුන්සිලයෙන් කලාවන් හා සංහිඳියාව පිළිබඳ පර්යේෂණ ප්‍රදානයක් ලබාගැනීම මගින් 2018 හා 2019 වර්ෂවලදී ඉලක්ක 1 සහ 2 සඳහා දායක වී ඇති අතර, එය බෙල්ෆාස්ට්හි ක්වීන්ස් විශ්වවිද්‍යාලයේ **Senator George J Mitchell Institute for Global Security** and Peace සමඟද සහයෝගිතාවක් ගොඩනංවා ඇත. 2020 වර්ෂයේදී මෙම වසංගතය හේතුවෙන් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට මෙම ඉලක්ක සක්‍රීය ලෙස ලභාකරගැනීමට නොහැකි වූ නමුත්, මෙම තත්ත්වය සාපේක්ෂව සාමාන්‍ය තත්ත්වයට ළඟාවූ අවස්ථාවකදී වැඩිදුර විකල්ප සොයායාමට ආයතනය සැලසුම් සකස් කරයි.

5. මූල්‍ය ප්‍රකාශ (නව ආකෘතියට අනුව)

(අ) පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

විෂයය	2016 රු.	2017 රු.	2018 රු.	2019 රු.	2020 රු.
අ. පෞද්ගලික පඩිනඩි	12,660,591	15,416,958	20,571,071	27,805,689	30,507,298
ආ. ගමන් බිමන්	70,314	94,331	824,529	1,075,642	55,568
ඇ. සැපයුම්	787,345	974,909	706,220	650,503	416,445
ඈ. නඩත්තු	156,944	260,348	652,923	749,336	563,669
ඉ. කොන්ත්‍රාත්තු සේවාවන්	854,828	1,454,608	1,404,754	798,326	722,511
ඊ. වෙනත්	2,273,112	4,880,962	5,461,528	4,374,603	3,877,299
මුළු	16,803,134	23,082,116	29,621,027	35,454,102	36,142,793

(ආ) ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

විෂයය	2016 රු.	2017 රු.	2018 රු.	2019 රු.	2020 රු.
අ. ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ අත්පත්කරගැනීම	2,153,746	4,565,746	134,900	61,000	753,224
ආ. යන්ත්‍රෝපකරණ අත්පත්කරගැනීම		7,878,631	-		
ඇ. පුස්තකාල පොත් අත්පත්කරගැනීම	87,347	211,280	213,703	25,752	
ඈ. ගොඩනැගිලි හා ව්‍යුහ අත්පත්කරගැනීම	46,346,778	1,190,330	-	495,894	46,000
ඉ. වෙනත්		5,661,631	21,500		
මුළු	48,587,871	19,507,117	370,103	582,646	799,224

(ඇ) මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

විෂයය	2020 වර්ෂය තුල ප්‍රතිපාදන රු.	2020 වර්ෂය තුල වියදම් රු.	ඉතුරුම්/අතිරික්තය රු.
අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන	29,100,000	30,507,298	(1,407,298)
ආ. ව්‍යාපෘති හැර ප්‍රාග්ධන	500,000	799,224	(299,224)
ඇ. දේශීය ආශයෙන් අරමුදල් සපයන ලද ව්‍යාපෘති			
ඈ. විදේශ අරමුදල් සපයන ලද ව්‍යාපෘති			
මුළු	29,600,000	31,306,522	(1,706,522)

(ඈ) මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ජනනය වූ ආදායම්)

ආදායම් මූලාශ්‍රය	2020 වර්ෂය තුල ප්‍රතිපාදන රු.	2020 වර්ෂයේ එක්රැස්කිරීම්	හිඟය/අතිරික්තය රු.
අ. මූලික උපාධි අධ්‍යයන			
ආ. පශ්චාත් උපාධි අධ්‍යයන	**14,305,460**	**14,817,382**	**(511,922)**
ඇ. උපදේශක සේවාවන්			
ඈ. වෙනත්			
මුළු	**14,305,460**	**14,817,382**	**(511,922)**

(ඉ) මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

විෂයය	සමීකරණය	ශිෂ්‍යයෙකු සඳහා වියදම රු.
අ. ශිෂ්‍යයෙකු සඳහා පුනරාවර්තන වියදම (RE)	පුනරාවර්තන වියදම/ශිෂ්‍ය සංඛ්‍යාව	**69,239.07**
ආ. ශිෂ්‍යයෙකු සඳහා ප්‍රාග්ධන වියදම (CE)	ප්‍රාග්ධන වියදම/ශිෂ්‍ය සංඛ්‍යාව	**1,531.08**
මුළු	**-**	**70,770.15**

6. විගණන කමිටුවේ වාර්තාව

විගණන කමිටු වාර්තාව

<u>අභ්‍යන්තර විගණන වාර්තාව</u>

පහත සඳහන් සුවිශේෂී කාර්යය ක්ෂේත්‍ර ආවරණය කරමින්, සමාලෝචනයට යටත් වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය මගින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ හරයාත්මක ක්ෂේත්‍රයන්හි විගණනය කිරීමේ කාර්යයන් ඉටු කරන ලදී.

1. <u>පූර්ව විගණනය</u>

* විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල නිදහස් කිරීම
* පාරිතෝෂික ගෙවීම
* විශ්‍රාම අරමුදල නිදහස් කිරීම
* කොන්ත්‍රාත් මුදල් අවසන් ගෙවීම් හා රඳවාතබාගැනීම් නිදහස් කිරීම

2. <u>සොයාගැනීම් මත නිකුත් කරන ලද විගණන විමසුම්</u>

1. විගණන වාර්තාව-**2020**-පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය-**VV/19/AQ/2020/PGIE/01**

3. <u>විගණන කමිටුව</u>

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම පිණිස, එම ආයතනයේ විගණන කමිටුව නිතිපතා මාස දෙකකට වරක් රැස් වෙයි. මෙම කමිටුව, විගණකාධිපතිවරයා හා අභ්‍යන්තර විගණනය විසින් එවන ලද විගණන වාර්තා හා විමසුම් සහ එම විමසුම් සඳහා මෙම ආයතනය විසින් ලබා දෙන ප්‍රතිචාර සලකා බලයි. මෙම කමිටුව මගින් නිර්දේශ ඉදිරිපත් කරනු ලබන අතර, නිවැරදි කිරීමේ ක්‍රියා සඳහා මාර්ගෝපදේශනද අධීක්ෂණය කරයි.

දැනට පවත්නා කෝවිඩ්-19 තත්ත්වය හේතුවෙන්, මෙම විගණන කමිටුව සමාලෝචනයට යටත් වර්ෂය තුළ අවස්ථා තුනකදී රැස් වී ඇත.

4. <u>කාර්යමණ්ඩලය</u>

පහත සඳහන් කාර්යමණ්ඩල සාමාජිකයින්ගෙන් අභ්‍යන්තර විගණන අංශය සමන්විත වේ .

* ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයෙකු
* වැඩබලන සහකාර අභ්‍යන්තර විගණකවරයෙකු
* විගණන සහකාරවරයෙකු
* ලිපිකරුවෙකු
* පරිගණක යෙදවුම් සහකාරවරයෙකු
* කම්කරුවෙකු

7. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ



පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන
2020

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වත්කම්		2020	2019
		(රු.)	(රු.)
ජංගම වත්කම්	සටහන්		
බැංකුවේ මුදල්	1	1,208,216	2,567,070
කාර්යමණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම්	2	1,364,365	612,168
සිසුන්ගෙන් ලැබිය යුතු	3	4,306,380	7,065,040
කෙටි කාලීන ආයෝජන	4	81,331,800	58,331,800
භාණ්ඩ ලේඛන		175,988	321,419
පූර්ව ගෙවීම් සහ ලැබිය යුතු	5	223,593	193,059
කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු අත්තිකාරම්			
		88,610,342	69,090,557
		=========	=========
ජංගම නොවන වත්කම්			
ලී බඩු සහ උපාංග	6	2,682,418	3,046,322
කාර්යාල උපකරණ		894,850	1,260,800
පුස්තකාල පොත් සහ කාලීන සඟරා		2,018,062	2,522,578
පරිගණක හා උපාංග		2,689,634	3,303,311
පාපැදිය		1,000	2,000
උපාධි ලෝගු		-	-
වෙනත් වත්කම්			3,366
යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ		3,013,499	4,589,225
ඉඩම		-	
ගොඩනැගිල්ල		71,571,655	76,130,856
අස්පෘශ්‍ය වත්කම්	7	128,992	246,992
		83,000,111	91,105,450
මුළු වත්කම්		171,610,453	160,196,007
		==========	==========
වගකීම්			
ජංගම වගකීම්			
උපචිත වියදම්	8	3,046,898	3,393,062
උපචිත පර්යේෂණ ප්‍රදාන		580,115	580,116
සුළු ණයහිමියන්	9	155,846	638,335
කලින් ලද ශිෂ්‍ය ගාස්තු	10	13,990,890	6,383,276
ඉදි කිරීම් මත රඳවා තබා ගැනීම්		2,011,359	2,011,359

අත්තිකාරම්හි පොලිය		620,623	170,634
		20,405,731	13,176,781
		=========	=========
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	11	6,192,417	2,793,721
මුළු වගකීම්		26,598,148	15,970,502
දළ වත්කම්		145,012,305	144,225,505
		=========	=========
දළ වත්කම්/මුදල් සමානයන්			
ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් වූ	12	82,545,844	90,796,473
ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් නොවූ	13		-
ඉඩම් තක්සේරුකරණ සංචිතය		2,527,516	-
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන සංවර්ධන අරමුදල		3,967,500	3,967,500
පර්යේෂණ ප්‍රදාන අරමුදල්		650,000	
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන සාමාන්‍ය සංචිතය		55,321,444	49,278,185
පර්යේෂණ ප්‍රදාන			183,346
මුළු දළ වත්කම්/මුදල් සමානයන්		145,012,305	144,225,505
		=========	=========

පිටු අංක 5 සිට 7 දක්වා සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 8 සිට 16 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යන්ත කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ සම්පාදනය කිරීමෙහි සහ ඉදිරිපත් කිරීමෙහි ලා කළමනාකරණ මණ්ඩලය වග කියනු ලබයි. එම මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලද අතර, මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබා ඇත.

ආචාර්ය එච්.එස්.රඹුක්වැල්ල	කළමනාකරණ මණ්ඩල	කළමනාකරණ මණ්ඩල	ඩබ්.ඩී.ටී.නිලකරත්න මහතා	එස්. සී. මුණසිංහ මහත්මිය
අධ්‍යක්ෂ	සාමාජික	සාමාජික	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	නියෝජ්‍ය මූල්‍යාධිකාරී

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

2020 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

	සටහන	අයවැය 2020 (රු.)	2020 (රු.)	2019 (රු.)
ආදායම				
රජයේ පුනරාවර්තන ප්‍රදාන		**29,100,000**	**29,100,000**	**23,500,000**
අයදුම්පත්‍ර ගාස්තු		**339,000**	**385,000**	**203,5000**
ලියාපදිංචි කිරීමේ ගාස්තු		**199,500**	**539,553**	**363,691**
පංති ගාස්තු		**11,021,900**	**10,683,680**	**14,362,525**
විභාග ගාස්තු		**159,020**	**215,570**	**1,396,790**
අතිරේක ගාස්තු		**124,040**	**394,274**	**212,808**
නිබන්ධන ගාස්තු		**1,100,000**	**1,100,375**	**1,034,033**
කළඹ ගාස්තු		**100,000**	**90,250**	**198,500**
කෙටි පාඨමාලාවලින් ලද පංති ගාස්තු		**1,202,000**	**1,337,000**	**656,000**
පොලී ආදායම	**14**	**3,148,670**	**3,535,351**	**4,251,751**
විවිධ ලැබීම්		**60,000**	**69,680**	**411,424**
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය			**8,750,629**	**8,389,827**
නැවත තක්සේරු කිරීමේ අතිරික්තය				**2,068,222**
මුළු ආදායම		**46,554,130**	**56,203,362**	**57,049,071**
වියදම්				
පෞද්ගලික වැටුප් හා දීමනා	**15**	**30,972,000**	**30,507,298**	**27,805,690**
ගමන් වියදම්	**16**	**61,000**	**55,568**	**1,075,642**
සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය	**17**	**294,000**	**416,445**	**650,504**
නඩත්තු වියදම්	**18**	**371,000**	**563,669**	**749,336**
කොන්ත්‍රාත් සේවා	**19**	**780,000**	**722,512**	**798,327**
වෙනත් පුනරාවර්තන වියදම්	**20**	**4,325,000**	**3,877,300**	**4,374,604**
ක්ෂය වීම්			**8,776,912**	**8,408,507**
පාරිතෝෂික වියදම්			**3,398,696**	**631,518**
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය			**118,000**	**118,000**
මානව ප්‍රාග්ධන වියදම්				**78,800**
නැවත තක්සේරුකිරීමේ හිඟය				
මුළු වියදම්		**36,803,000**	**48,436,401**	**44,690,927**
කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය)		**9,751,130**	**7,766,962**	**12,358,145**

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

2020 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා දළ වත්කම්/මුදල් සමානයන්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

(රු.)

	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාන්‍ය සංචිතය	නැවත තක්සේරු කිරීමේ අතිරික්තය	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සංවර්ධන අරමුදල	පර්යේෂණ ප්‍රදාන අරමුදල	වැය වූ ප්‍රාග්ධන ප්‍රදාන	වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන	මුළු එකතුව
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**36,695,746**		**3,967,500**		**99,186,301**	**-**	**139,849,547**
					-	-	
පෙර වසරේ ගැලපුම්	**224,295**						
වසර තුල වැය වූ ප්‍රාග්ධන ප්‍රදාන							
වසර තුල ලද අරමුදල්							
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය					**(8,389,827)**		
නැවත තක්සේරු කිරීමේ ලාභ/පාඩු							
කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය)	**12,358,145**						
2019දෙසැම්බර් 31 දිනට ශේෂය	**49,278,185**	**-**	**3,967,500**		**90,796,473**	**-**	**144,042,159**
	========		=======		========		=========
පෙර වසරේ ගැලපුම්	**(1,723,703)**	**2,527,516**					
වසර තුල වැය වූ ප්‍රාග්ධන ප්‍රදාන					**500,000**	**(500,000)**	
වසර තුල ලද අරමුදල්						**500,000**	
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය					**(8,750,629)**		
නැවත තක්සේරු කිරීමේ ලාභ/පාඩු							
කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය)	**7,766,962**						
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**55,321,444**	**2,527,516**	**3,967,500**	**650,000**	**82,545,845**	**-**	**145,012,305**

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

2020 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2020	2019
	(රු.)	(රු.)
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ		
සාමාන්‍ය කටයුතුවලින් ලද අතිරික්තය/(හිඟය)	**7,766,962**	**12,358,145**
කෙටි කාලීන ආයෝජනවලින් ලද පොලී ආදායම	**(3,535,351)**	**(4,251,751)**
මුදල් නොවන ප්‍රවාහ		
ක්ෂයවීම්	**8,776,912**	**8,408,507**
පෙර වසරේ ක්ෂයවීම් ගැලපුම්		**157,900**
පාරිතෝෂික වියදම්	**3,398,696**	**631,518**
පෙර වසරේ පාරිතෝෂික ගැලපුම්		
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	**(8,750,629)**	**(8,389,827)**
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	**(118,000)**	**118,000**
පරිත්‍යාග ක්‍රමක්ෂය		
පෙර වසරේ ගැලපුම්	**803,813**	**224,295**
වත්කම් බැහැරකිරීම මත පාඩුව	**9,652**	
නැවත තක්සේරුකිරීමේ අතිරික්තය		**(2,068,222)**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පූර්ව දල අතිරික්තය	**8,352,054**	**7,188,564**
කාරක ප්‍රාග්ධනයේ (ඉහළ යාම)/පහළ යාම		
භාණ්ඩ ලේඛනවල (ඉහළ යාම) /පහළ යාම	**145,431**	**379,680**
ගෙවිය යුතු ගෙවීම්වල ඉහළ යාම/ (පහළ යාම)	**7,228,950**	**2,024,366**
ලැබිය යුතු ආදායම්වල (ඉහළ යාම)/පහළ යාම	**2,728,126**	**263,345**
කාර්ය මණ්ඩලය වෙත ණය සහ අත්තිකාරම්හි (ඉහළයාම)/පහළ යාම	**(752,197)**	**581,013**
පාරිතෝෂික ගෙවීම්		
මෙහෙයුම් කටයුතුවලින් දල මූල්‍ය ප්‍රවාහ	**17,702,365**	**10,436,968**
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ		
දේපල, උපාංග සහ උපකරණ මිලදී ගැනීම	**(753,224)**	**(61,000)**
පොත් සහ කාලීන සඟරා මිලදී ගැනීම		**(25,752)**

අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම		
පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ගොඩනැගිලි ව්‍යාපෘතිය	**(46,000)**	**(495,894)**
ආයෝජනවලින් ලද පොලිය	**3,535,351**	**4,251,751**
කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම්		
විශේෂිත කාර්යයන් සඳහා ලද අරමුදල්	**650,000**	
විශේෂිත කාර්යයන් සඳහා මුදල් ගලායාම්	**(183,346)**	**(3,162,909)**
පුනරාවර්තන පුනරුත්ථාපන වියදම්		
ඉඩම		
කෙටි කාලීන ආයෝජනවලින් ලද පොලිය		
කෙටි කාලීන ආයෝජන ආපසු ගැනීම්		**2,500,000**
නව කෙටිකාලීන ආයෝජන	**(22,727,460)**	**(12,900,000)**
ආයෝජන කටයුතුවලින් ලද දල මුදල් ප්‍රවාහ	**(19,524,679)**	**(9,893,804)**
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ		
භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	**500,000**	
මූල්‍ය කටයුතුවලින් ලද දල මුදල් ප්‍රවාහ	**500,000**	
මුදල් සහ මුදල් සමානයන්හි දල ඉහළ යාම/ (පහළ යාම)	**(1,322,314)**	**543,164**
වසර මුලදී මුදල් සහ මුදල් සමානයන්	**2,567,070**	**2,088,525**
වසර අගදී මුදල් සහ මුදල් සමානයන්	**1,244,756**	**2,631,689**

සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

01. වාර්තා කිරීමේ ආයතනය

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, **2005** අංක **04** දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන ආඥාපනත යටතේ සංස්ථාපනය කරනු ලැබ ඇත. එය **2006** ඔක්තෝබර් මස **1**වන දින දියත් කරන ලදී. වර්තමානයේදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පශ්චාත් උපාධි පාඨමාලා සහ කෙටි කාලීන පාඨමාලා පවත්වනු ලැබේ.

02. අනුගතවීමේ ප්‍රකාශය

ඓතිහාසික පිරිවැය සම්මුතියක් සහ උපචිත පදනමක් මත හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුගතව පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූල්‍ය ප්‍රකාශ සම්පාදනය කරනු ලැබ ඇත.

03. රජයේ ප්‍රදාන

මෙම වසර සඳහා ලද මුළු රජයේ ප්‍රදාන ප්‍රමාණය රු. **29,600,000/-** කි. රු.**29,100,000/-**ක් වන පුනරාවර්තන ප්‍රදාන, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ආදායම් ලෙස හඳුනාගනු ලැබ ඇත. ලද ප්‍රාග්ධන ප්‍රදාන, වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම්ගත කරනු ලැබ ඇති අතර, වැය කළ ප්‍රමාණය, වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට මාරු කරන ලදී.

	2020 වසර තුල ලද මුදල් ප්‍රමාණය (රු.)	**2020** වසර තුල වැය නොකළ මුදල් ප්‍රමාණය (රු.)
පුනරාවර්තන ප්‍රදාන	**29,100,000**	-
ප්‍රාග්ධන ප්‍රදාන	**500,000**	
	29,600,000	

ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය

ප්‍රාග්ධන ප්‍රදාන සහ ලද වෙනත් ප්‍රදාන ප්‍රාග්ධනීකරණය කරන ලද අතර, ආශ්‍රිත වත්කම්හි ජීව කාලය මත ආදායම ලෙස ක්‍රමක්ෂය කරන ලදී.

04. දේපල, පිරියත සහ උපකරණ

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති **7**ට අනුව, දේපල, පිරියත සහ උපකරණ ක්ෂය කර ඇත. එහෙයින්, වත්කමක් භාවිත කළ හැකි අවස්ථාවලදී, එම වත්කම ක්ෂය කරනු ලැබ ඇත.

(ආ) වාර්ෂික ක්ෂය කිරීම් අනුපාත පහත පරිදි වේ:

- ලී බඩු සහ උපාංග **10%**
- කාර්යාල උපකරණ **20%**
- පරිගණක සහ උපාංග **20%**

- පොත් සහ කාලීන සඟරා 20%
- පිරියත හා උපකරණ 20%
- පාපැදිය 20%
- උපාධි ලෝගු 20%
- වෙනත් වත්කම් 20%
- පරිගණක මෘදුකාංග 20%
- ගොඩනැගිල්ල 5%

(ඇ) ජංගම නොවන වත්කම්හි ඇස්තමේන්තුගත ජීව කාලය මත ආදායම් ප්‍රකාශය තුල ක්ෂය වීම් අය කෙරේ.

(ඈ) සමුච්චිත ක්ෂයවීම් අඩු කළ පිරිවැය තුල ජංගම නොවන වත්කම් පෙන්නුම් කෙරේ.

(ඉ) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් මිලදී ගන්නා ලද පොත් සහ කාලීන සඟරා එම ආයතනයේ ශිෂ්‍යයින්ගේ ප්‍රතිලාභය උදෙසා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය වෙත යවනු ලැබ ඇත.

(ඊ) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩමේ අයිතිය එම ආයතනය වෙත නීත්‍යානුකූලව පවරා නොමැත්තේ, විවෘත විශ්වවිද්‍යාලයේ අනුබද්ධිත ආයතනයක් ලෙස මෙම ආයතනය ක්‍රියාත්මක වන හෙයින් සහ එම ඉඩම සිය භාරයට ගැනීම පිණිස, ආයතනයේ ආඥාපනතේ කිසිදු නීතිමය විධිවිධානයක් අන්තර්ගත නොවන හෙයිනි. එසේ වුවද, තක්සේරුකරණ දෙපාර්තමේන්තුව විසින් රු.22,500,000/- ලෙස තක්සේරු කරනු ලැබ ඇති පර්චස් 15ක ඉඩම පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වත්කමක් ලෙස වාර්තා කර තිබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07ට අනුගතව මෙම ඉඩමේ වටිනාකම රු.22,500,000/- ලෙස අනාවරණය කිරීමට තීරණය කර ඇත.

05. කෙටිකාලීන ආයෝජන

හදිසි අවශ්‍යතා සඳහා අවශ්‍ය නොවන මුදල් මහජන බැංකුවේ කෙටි කාලීන ස්ථාවර තැන්පතුවල සහ බැංකු කටයුතුවල (TB) ආයෝජනය කරන ලදී. වසර අවසානයේ කල් පිරුණු පොලී ආදායම ඇතුලත්ව ආයෝජනයේ ශුද්ධ වටිනාකම ගණනය කරනු ලැබ ඇත.

06. තොග තක්සේරු කිරීම

ගබඩාවල පවතින තොගවල වටිනාකම First in First out (FIFO) පදනම භාවිත කරමින් ගණනය කරනු ලැබ ඇත.

07. වගකීම්

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, දත් සියලුම වගකීම් සැලකිල්ලට ගනු ලැබ ඇත.

08. බැංකුවේ පවත්නා මුදල්

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ජංගම ගිණුම් අංක 174100246838310 හා 174100336838310 සම්බන්ධ කරන ලද ඉතුරුම් ගිණුම් දෙකක් විවෘත කරන ලදී. මුළු වසර පුරාම රු.100,000/- ක ශේෂයක් මෙම ජංගම ගිණුම්වල පවත්වාගෙන යන ලදී.

09. අස්පෘශ්‍ය වත්කම්

මිලදී ගත් පරිගණක මෘදුකාංග, පිරිවැය අඩු කරන ලද උපචිත ක්‍රමක්ෂය ලෙස සඳහන් වේ.

10. ප්‍රතිපාදන

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයින් සම්බන්ධයෙන් පාරිතෝෂික ප්‍රතිපාදන ගණනය කරනු ලැබ ඇත. එසේ වුවද, විශ්වවිද්‍යාල පද්ධතිය තුල වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයින් හට විශ්‍රාම ගැනීමේදී පාරිතෝෂික ලබා ගැනීමට හිමිකම ලැබේ.

11. ආදායම් හඳුනාගැනීම

ආදායම් රජයේ ප්‍රදාන සහ අභ්‍යන්තර මූලාශ්‍ර මඟින් ජනනය වූ ආදායමින් සමන්විත වේ. ආයෝජන මත පොලිය උපචිත පදනමක් මත ගිණුම්ගත කරනු ලබයි.

12. වියදම් හඳුනාගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ සහ පොදු වාර්තා කිරීමේ පද්ධති ආකෘතිය මත පදනම්ව, වියදම විශ්ලේෂණය කර, වැය ශීර්ෂවලට වර්ගීකරණය කරනු ලැබ ඇත.

13. බදුකරණය

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ලාභාංශවලින් ලද ලාභ සහ ආදායම හැර ලාභ සහ ආදායම **2006** අංක **10** දරන දේශීය ආදායම් පනත යටතේ ආදායම් බදුවලින් නිදහස් වේ.

14. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

